ගරු කථානායකතුමනි, ඉඩම් සංවර්ධන පනත යටතේ එක්තරා සංශෝධනයක් මෙයට පෙර අවස්ථාවකදී පිළිගත් බව ඇමතිතුමාට මතක ඇති. ගම් පුළුල් කිරීමේ ක්‍රමය යටතේ යම්කිසි යෝජනාවක් ඉදිරිපත් වුණොත් මාසයක් ඇතුළතදී ඒ පිළිබඳව තීරණයක් දෙන්නට ඕනෑය කියන එම සංශෝධනය පිළිගත්තා. එසේ පිළිගත්තත් අවුරුදු දෙකක පමණ කාලයක් ගත වී තිබියදීත් ඒ සම්බන්ධයෙන් තීරණයක් ගෙන තිබුණේ නැහැ. අමාත්‍යාංශය තුළ එවැනි ප්‍රමාදයන් තිබෙන නිසා ඉක්මනට නඩු අසන්නය කියා ශ්‍රේෂ්ඨාධිකරණයට නියෝග නිකුත් කිරීමට පෙර තමාගේ අමාත්‍යාංශයේ තිබෙන ඒ අඩුපාඩුකම් හරිගස්සා ගන්නවා නම් ඇමතිතුමාගෙන් ලොකු සේවයක් වන බව මගේ විශ්වාසයයි. මේ තාක් කල් මේ කාරණය ගැන අමාත්‍යාංශය ක්‍රියා නොකළ නිසා ඉඩම් හිමියන් දැන් ඒ ඉඩම කොටස් කර විකුණන්නට උත්සාහ කරනවාය කියා මට දැන ගන්නට ලැබී තිබෙනවා. අද දවල් දෙකට මන්ත්‍රී මණ්ඩලයට පැමිණියාට පසු මා නමට තැපෑලෙන් එවා තිබුණු ලිපියක් මේ දැන් ලැබුණා. ඒ වත්තේ වැඩ කරන සේවකයන් හැට අට දෙනෙකු අත්සන් කර තිබෙන මේ ලිපිය ඒ. වයි. පියසේන කියන මහත්මයාගේ නමින් එවා තිබෙනවා. අත්පත් කර ගැනීමේ ප්‍රමාදය නිසා ඇද්දුන්කැලේ වත්තේ අයිතිකරුවන් දැන් ඒ වත්ත අක්කර පහේ දහයේ කැලිවලට කඩා පෞද්ගලිකව විකුණන්නට උත්සාහ කරනවාය, එම නිසා අපට රක්ෂාවත් නැති වෙන්නට යනවාය කියා මේ ලිපියෙන් කියනවා. මෙවැනි ප්‍රමාදවීම් නිසා කොයි තරම් බරපතළ ප්‍රශ්න මතු වන්නට ඉඩ තිබෙනවා ද? එම නිසා ශ්‍රේෂ්ඨාධිකරණය ලවා මේ වැඩ කටයුතු ඉක්මනින් කරවා ගන්නවා වාගේම තමාගේ අමාත්‍යාංශයේ නිලධාරීන්ටත් උපදෙස් දී මෙවැනි ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්‍යයන් දැනට වඩා ඉක්මනින් කරවා ගැනීමට පියවර ගන්න ලෙස මා ඉල්ලීමක් කරනවා.

අ. භා. 3.22

ජයකොඩි මයා.

(திரு. ஜயக்கொடி)

(Mr. Jayakody)

ගරු කථානායකතුමනි, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනත් කෙටුම්පත එතුමා විසින්ම කප්පාදු කර සංශෝධනය කරන ලදුව ඊයේ මේ ගරු සභාවට ඉදිරිපත් කළ ඒ සංශෝධනයත් අවසානයේදී කප්පාදු වන තැනට දැන් කරුණු යෙදී තිබෙනවාය කියා අපට දැන ගන්නට තිබෙනවා. මේ පනත් කෙටුම්පත පිළිබඳ විවාදයේදී අගල

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

වත්තේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) කරුණු රාශියක් ඉදිරිපත් කරමින් කථා කළ නිසා මේ පනත් කෙටුම්පතේ කිසිම දෙයක් ඉතිරි නොවී අවසානයේදී අළුත් සංශෝධන දෙකක් ගරු ඇමතිතුමා ඉදිරිපත් කරනු ලැබුවා. පළමුවන සංශෝධනයෙන් කියන්නේ පුළුවන් තරම් දුරට උසාවිය මාර්ගයෙන් උසස් ප්‍රමුඛත්වයක් දීම යුක්තිසහගත බවයි. දෙවන සංශෝධනයෙන් ඇමතිතුමා ඉදිරිපත් කරන යම් යම් තීරණ සම්බන්ධව උසාවිය මාර්ගයෙන් බලාපොරොත්තු වන්නට යන තීරණවලට එකඟත්වය දිය යුතුය කියනවා.

ඇත්ත වශයෙන් ම මා කණගාටු වන්නේ එක් කාරණයක් ගැනයි. ගරු ඇමතිතුමා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ මුල් පනත කියවා මේකෙ වෙනසක් කරන්නට ඕනෑය කියා අබ මල් රේනුවක තරම්වත් හැඟීමක් නැතිවයි. ඒකයි මගේ පළමුවන චෝදනාව. 1950 කාලයේ සිට අද දක්වාම ප්‍රාණවත් ලෙස යම් පනතක් ක්‍රියාත්මක වී තිබෙනවා නම් එය මේ පනත බව තමුන්නාන්සේලා කවුරුත් දන්නවා. නමුත් මේ පනත සංශෝධනය කිරීම සම්බන්ධව ගරු ඇමතිතුමා කිසිම සැලකිල්ලක් දැක්වූයේ නැහැ. ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදයන් ගැන මේ ගරු සභාවේ වරින් වර කරුණු දක්වා තිබෙනවා. ඉඩම් ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ ගරු මන්ත්‍රීවරුන් වැඩියෙන්ම සාකච්ඡා කර තිබෙන්නේ මේ තත්ත්වය ගැනයි. ඉතාම ඉක්මනින් ඉඩම් අත්පත් කර ගත හැකි ක්‍රම මොනවාද, ගත යුතු ඉඩම් මොනවාද, නොගතයුතු ඉඩම් මොනවාද, රජයේ කටයුතුවලට වුවමනා කරන ඉඩම් මොනවාද, නොගතයුතු ඉඩම් මොනවාද, රජයේ කටයුතුවලට වුවමනා කරන ඉඩම් මොනවාද, වෙනත් දෙපාර්තමේන්තුවලින් ගත යුතු ඉඩම් මොනවාද, යන මේ කරුණු ගැන තමයි වැඩියෙන්ම සාකච්ඡා වී තිබෙන්නෙ. නමුත් ඉඩම් ඇමතිතුමා මේ මොහොත වන තෙක් ඉඩම් අත්පත් කර ගැනීමේ පනත සංශෝධනය කිරීම සඳහා වෑයමක් නොදැරූ එක ගැනයි අපේ කණගාටුව.

මට තවත් චෝදනාවක් කරන්නට සිඩ වී තිබෙනවා. එතුමා ගන්න තීරණ සතියෙන් සතිය වෙනස් වෙනවා. අද යම් ඉඩමක් ගන්නට තීරණයක් කළොත් හෙට ඒ තීරණය වෙනස් කර වෙනත් ඉඩමක් ගන්නට තීරණය කරනවා. ඒ කාරණය උඹ ගරු ඇමතිතුමාට අදහස් කීපයක් ඉදිරිපත් කරන්නට කැමතියි. ඉඩම් අත්පත් කර ගැනීම දැනට වඩා ඉක්මන් කිරීම සඳහා කළ හැක්කේ කුමක්ද? අද තිබෙන නීති රීති උඹ වැඩ කරන්නට යැමෙන් නොයෙකුත් කරදර ඇති වෙනවා. එපමණක් නොව ඒ නිසා වැඩ කටයුතු අවුරුදු ගණන් ප්‍රමාද වෙනවා. ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳව සම්පූර්ණ බලතල තිබෙන්නේ ඉඩම් ඇමතිතුමා යටතේ තිබෙන ඉඩම් දෙපාර්තමේන්තුවටයි. එහෙත් ගම් පළල් කිරීම යටතේ හෝ වේවා, රජයේ කටයුතු සඳහා හෝ වේවා ඉඩම් අත්පත් කර ගන්නට යන සෑම අවස්ථාවකදීම ඒ ඒ ප්‍රදේශයේ දිසාපතිවරයා අතින් සිදු විය යුතු වැඩ රාශියක් තිබෙනවා. දිසාපතිවරයා වැඩ අධික පුද්ගලයෙක්. ප්‍රාදේශීය වශයෙන් ඇති හැම වැඩකටම ඔහු සම්බන්ධයි. ඒ අතර ඉඩම් ඉල්ලන්නටත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 4 වැනි වගන්තිය යටතේ යම් යම් කරුණු ඉදිරිපත් කළාම ඒවා ගැන සොයා බලන්නටත් යනාදී වශයෙන් ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳව ඔහුට වැඩ කොටසක් පැවරී තිබෙනවා. ඇයි මේ හැම වැඩක්ම දිසාපතිවරයාට භාර දී තිබෙන්නේ? ඉඩම් ඇමතිතුමා ඉන්නවා. ඒ ඇමතිතුමාගේ ස්ථිර ලේකම්තුමා ඉන්නවා. ඊට පසුව ඉඩම් අත්පත් කර ගැනීමේ දෙපාර්තමේන්තුව තිබෙනවා. ඉඩම් කොමසාරිස්තුමා සිටිනවා. ඒ ඒ කච්චේරිවල දිස්ත්‍රික් ඉඩම් නිලධාරීන් සිටිනවා. ඊළඟට එස්. එල්. ඕ. නමින් නිලධාරීන් පිරිසක් ඉන්නවා. ඕ. එල්. ඕ. ඕ. නමින් තවත් නිලධාරීන් පිරිසක් සිටිනවා. ඉඩම් අමාත්‍යාංශයේ සිට ගමේ මට්ටම දක්වාම ගරු ඇමතිතුමාගේ නිලධාරීන් සිටිනවා. ඇයි ඒ නිලධාරීන්ගෙන් ප්‍රයෝජන නොගන්නේ? ඉඩම් අත්පත් කර ගැනීමේ හැම කටයුත්තක්ම දිසාපතිතුමාට පැවරී තිබෙනවා. මේ නිසා ඒ කටයුතු ප්‍රමාද වන බවත් අමුතුවෙන් කිව යුතු නැහැ. මේ ක්‍රමයෙන් කටයුතු ප්‍රමාද වෙනවා නම් ඉක්මන් ක්‍රමයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

අනුගමනය නොකරන්නේ ඇයි? ඒ නිසා දැන් තිබෙන ක්‍රමයට වඩා ලිහිල් ක්‍රමයක් සකස් කොට එතුමා යටතේ සිටින නිලධාරි පැළැන්තියෙන් වැඩක් ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා. මේ වැඩ වලින් දිසාපතිතුමා අයින් කර දමන්න. ඉඩම් අමාත්‍යාංශයේ සථිර ලේකම්තුමා, ඉඩම් කොමසාරිස්තුමා, එස්. එල්. ඩී. ඕ. වරුන්, ඕ. එල්. ඩී. ඕ. වරුන්, ඊට පසුව සිටින ගමේ මට්ටමේ නිලධාරීන් යන මේ අය ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු වලට උපයෝගී කර නොගන්නේ මන්ද? ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවල ප්‍රමාදයක් ඇති වී තිබෙනවා නම් එසේ ඇති වී තිබෙන්නේ ඒ සඳහා ක්‍රමවත් සැලැස්මක් නැති නිසයි.

ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ඇති පනතේ ඊට අදාළ වගන්ති ගණනාවක් තිබෙනවා. ඒ පනතේ 2 වැනි වගන්තිය තිබෙනවා; 4 වැනි වගන්තිය තිබෙනවා; 5 වැනි වගන්තිය තිබෙනවා; 7 වැනි වගන්තිය තිබෙනවා; ඒ 7 වැනි වගන්තියට අනුකූල 9 වැනි වගන්තිය තිබෙනවා; ඊළඟට 38 වැනි වගන්තිය තිබෙනවා. ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ලිහිල් කිරීම පිණිස මේ වගන්ති අඩු කිරීමට ගරු ඇමතිතුමාට යුතුකමක් තිබෙනවා. 2 වැනි, 4 වැනි, 5 වැනි, 7 වැනි, 9 වැනි සහ 37 වැනි මේ සෑම වගන්තියක් ගැනම කල්පනා කර බලා ඒ වගන්ති අඩු කර දමන්නට පුළුවන් සැලැස්මක් ඉදිරිපත් කරන්නට ගරු ඇමතිතුමාට පුළුවන් විය යුතුයි. ඒ සඳහා ගරු ඇමතිතුමා මෙම ගරු සභාවට සංශෝධනයක් ඉදිරිපත් කරන්නට ඕනෑ. මෙතෙක් ඒක නොකිරීම ගැන කනගාටුයි. ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු දැනට වඩා ඉක්මන් කරන්නට බැරි වී තිබෙන්නේ ඒ නිසයි.

දෙවැනි වගන්තියෙන් කියන්නේ මොනවාද? මා ඒ ගැනත් ගරු ඇමතිතුමාට කරුණු ටිකක් ඉදිරිපත් කරන්නට කැමතියි. ගරු ඇමතිතුමා ඒවා ගැන කල්පනා කරනැයි මා විශ්වාස කරනවා. අද ගම්වල ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සමහර විට අවුරුදු හතර, පහ ප්‍රමාද වී තිබෙන අවසථා තිබෙනවා. ඇමතිතුමාගේ හිතුමනාපය අනුව කරන කටයුතු නිසා යම් යම් ප්‍රමාදයන් ඇති වීම වෙනම දෙයක්. එහෙත් අද පාලන තන්ත්‍රයේ තිබෙන වැරදි සහ නීති රීතිවල තිබෙන අඩුලුහුඩුකම් නිසා නොයෙකුත් ප්‍රමාදයන් සිදු වන බව කියන්නට ඕනෑ. මෙම පනත පටන් ගන්නේ "Where the Minister decides" කියලයි. තීරණය කර ඉවරයි. "Decides" නමැති වචනය මොකට යෙදුවාද මා දන්නේ නැහැ. දෙවන වගන්තිය යටතේ "Where the Minister decides that land in any area is needed for any public purpose, he may direct the acquiring officer of the district in which that area lies to cause a notice in accordance with subsection (2) to be exhibited in some conspicuous places in that area." යනුවෙන් සඳහන් කරනවා. It further states that any officer authorized by the acquiring officer may enter any land in that area, together with such persons, implements, materials, vehicles and animals as may be necessary, and (*a*) survey and take levels of that land, (*b*) dig or bore into the subsoil of that land, (c) set out the boundaries of that land and the intended line of any work proposed to be done on that land—

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

Does the hon. Member intend to take every section of the Land Acquisition Act and make his observations on each? We are now debating an amending Bill. The hon. Member may refer to Section 2 in general.

ජයකොඩි මයා.

(திரு. ஜயக்கொடி)

(Mr. Jayakody)

In his amendments to the amending Bill the Hon. Minister refers to all these sections. For instance, he introduces a new Section 51A subsection (2) of which states, "This section shall apply to any decision made under section 4, any declaration made under section 5, and any order made under section 38."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Because of that you are starting with Section 2?

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

එතැනින් පටන් ගෙන එකපාරටම 4 වන වගන්තියට යනවා. එතැනදී තත්ත්වය වෙනස්. එහි මෙසේ කියනවා:

"where the Minister considers"—

තවම අරගෙන නැහැ. අරගන්නට සිතලා වත් නැහැ. ඉඩමට ඇතුළු වීමට ඉඩ දෙන වගන්තියේදී මෙසේ කියනවා:

"the Minister has decided"

4 වන වගන්තියට පැමිණි පසු මෙසේ කියනවා:

"where the Minister considers".

5 වන වගන්තියට පැමිණි පසු මෙසේ කියනවා:

"where he decides".

38 වන වගන්තියේදී මෙසේ කියනවා:

"where it becomes necessary".

මෙම වගන්ති දෙස බලන විට ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කිරීම සඳහා එක කාරණයක් කියන්නට කැමතියි. දෙවන සහ සිව්වන වගන්ති දෙක එකට එකතු කරන්න. අනික් ඒවා නම් පස් වන සහ හත් වන වගන්තියි. හත් වන වගන්තිය ගැන ගරු ඇමතිතුමා දන්නවා ඇති. ඉඩම ගන්නට බලාපොරොත්තු වන තැනැත්තා ඒ බව අයිතිකාරයාට දැනුම් දෙන ලිපිය ගැනයි කියන්නේ. එම වගන්ති දෙකත් එකට එකතු කර සංශෝධනයක් ගෙනාවා නම්, වගන්ති හතරක් යටතේ ඉදිරිපත් කරන නියෝග වගන්ති දෙකකින් ඉදිරිපත් කරන්නට තිබුණා. ඇයි මේවා ගැන කල්පනා නොකළේ? එක් ඉඩමක් ගන්නට ගිය විට එය මැනීම සඳහා සර්වේ ජනරාල් දෙපාර්තමේන්තුව මාස හයක් හතක් ගන්නවා. අග්නිදිග ආසියාවේ රටවල පිහිටි දෙපාර්තමේන්තු අතුරින් ලංකාවේ ඇති සර්වේ ජනරාල් දෙපාර්තමේන්තුව වඩාත් හොඳ සේවාවක් කරන්නට පුළුවන් දෙපාර්තමේන්තුවක් හැටියට නමක් ලබා තිබෙනවා. එහෙත් ඉඩමක ප්ලෑනක් ලබා ගන්නට ගියාම එතැනදීත් මාස හයක්වත් ගත වෙනවා. මේ ප්‍රමාදයන් නැති නොකරන්නේ ඇයි? හැම තැනටම වඩා ප්‍රමාද සිදු වන්නේ තක්සේරු දෙපාර්තමේන්තුවේ දීයි. තක්සේරු දෙපාර්තමේන්තුව ක්‍රියා කරන්නට පටන් ගන්නේ 7 වන වගන්තියට ආවායින් පසුවයි. ඇයි අර හතර වන වගන්තියෙන් කෙරෙන්නට තිබෙන කටයුතු අවසන් වෙනකොටම තක්සේරු දෙපාර්තමේන්තුව කටයුතු කරන්න ඉදිරිපත් වන්නෙ නැත්තෙ? තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය නිසා ඉඩමක් අත්පත් කර ගැනීමට ගිය අවස්ථාවේදී අඩුම ගණනේ අවුරුදු එකහමාරකට වඩා ප්‍රමාද වෙනවා. සමහර ඉඩම් කථානායකතුමනි, 38 වෙනි වගන්තිය යටතේ ආණ්ඩුවට ගත්තට පසුව වුවත්, තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය නිසා, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය නිසා, මොකක්ද සිද්ධ වෙන්නෙ? රජයට පවරා ගෙන අවුරුදු තුන හතරක් ගත වන තුරුම ඒ කටයුතු අවසන් කරන්නට ලැබෙන්නෙ නැහැ. ඒ කාලය අතරතුර, රජයට පවරා ගෙන තිබෙන රජයේ ඉඩම වෙනුවෙන් ඉඩම් හිමියාට සියයට දෙකේ පොළිය ගෙවන්නට සිදු වීමෙන් තමුන්නාන්සේලාගේ මුදල් ටිකත් අවසන් වෙනවා.

ඔය විධියට 1966 දී ගත් ඉඩමක් ගැන මා දන්නවා. තක්කවත්තෙ බරිගොඩ ඉඩම රජයට පවරා ගත්තේ 1966 දීයි. එහෙත් අද වන තුරු තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු ලිපි ලැබී නැහැ. එම ඉඩම 38 වෙනි වගන්තිය යටතේ තමුන්නාන්සේලා රජයට අයිතිකරගෙන අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ එහි විශාල ගොඩනැගිලි සහ විශාල කෘෂිකම් ව්‍යාපාරයකුත් ඇති කර තිබෙන නමුත්, අද වන තුරුම ඉඩම් හිමියාට මුදල් ගෙවා නැහැ. සියයට දෙකේ පොළිය පමණක් ගෙවනවා. එයින් ආණ්ඩුවට පාඩුයි. ඉඩම් හිමියාට හිරිහැරයි. ඔය වාගේ ප්‍රමාද වූ දහස් ගණනක් ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ නිසයි මේ සම්බන්ධයෙන් ඉක්මන් වැඩ පිළිවෙළක් යොදන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

කලින් කළා වාගේ මේ 2 සහ 4 එකට එකතු කර සංශෝධනයක් ගේන්න. 5 සහ 7 එකට එකතු කර සංශෝධනයක් ගේන්න. එය තමුන්නාන්සේලාට පහසුයි. අන්න ඒ විධියේ ලිහිල් කිරීමේ වැඩ පිළිවෙළක් තමුන්නාන්සේ ඉදිරිපත් කරාවි වරයකු හැටියට කටයුතු කරනවා.

ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු ගැන කථා කරන මේ අවස්ථාවේදී මේ රටේ ඉඩම් සම්බන්ධව මනා තේරුමකින් හා දැනීමකින් යුක්තව කටයුතු කළ නිලධාරීන් දෙදෙනකුගේ නම් සඳහන් කරන්න කැමතියි. එයින් එක්කෙනෙක් දැන් රජයේ සේවයේ නැහැ. ඔහු නම් එස්. එම්. පී. විජේමාන්න මහතායි. ඉඩම් අත්පත් කර ගැනීමේ පනත මුලින් ක්‍රියාත්මක කරන කාලයේදී දක්ෂ ලෙස ඔහු ඒ කටයුතු කර තිබෙනවා. ඊළඟට දැනට රජයේ සේවයේ යෙදී සිටින වී. පී. ඒ. පෙරේරා මහතායි. ඔහු දැනට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවය කරන බවයි මට දැනගන්න ලැබී තිබෙන්නෙ. ඉඩම් කටයුතු සම්බන්ධයෙන් ලංකාවේ සිටින දක්ෂ නිලධාරියෙක්, ඔහු. ඉඩම් ප්‍රශ්න ගැන දක්ෂ ලෙස එක පාරටම අසුවල් දේ කළ යුතුයි කියා තීරණයක් ගැනීමට සමත් දක්ෂතාවක් ඒ මහතාට තිබෙනවා. ඒ මහතා දැන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පරිපාලන නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු හැටියට කටයුතු කරනවා.

එතුමා දිසාපති හැටියට සිටි කාලයේදී ගම් පළල් කිරීමේ කටයුතු පිළිබඳව එක්තරා ක්‍රමයක් අනුගමනය කළා. එතුමා මොකක්ද කෙළේ ? තමුන්නාන්සේ දන්නවා මේ රටේ ජලගැලීම් නිසා ගෙවල් විශාල සංඛ්‍යාවක් අවුරුදු පතා කැඩෙන බව. හිනිදුම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි මයා.) පවා ඒ ගැන දන්නවා ඇති, එතුමාගේ ප්‍රදේශයෙ මේ ප්‍රශ්නය බලපාන නිසා. ජල ගැලීම් වලින් සිදු වන හානිය නිසා එක ගෙයකට රුපියල් 300 බැගින් ගෙවල් විශාල සංඛ්‍යාවකට අවුරුදු පතා මුදල් ගෙවන්න ආණ්ඩුවට සිද්ධ වෙනව. එක වරක් වතුර ගල නවා ; ගේ කැඩෙනවා ; රුපියල් 300 ක් ගෙවනවා. ඒ ගේම ඊළඟ අවුරුද්දේත් කැඩෙනවා. ; මුදල් ගෙවනවා. ඊළඟ අවුරුද්දේත් එහෙමමයි. ඔය විධියට අවුරුද්දක් ගානෙ එක ගෙයකට රුපියල් 300 බැගින් ගෙවනවා. අවුරුදු 10 කදී රුපියල් 3,000 ක් එක ගෙයක් වෙනුවෙන් ගෙවනවා. මෙය සඳහටම සිද්ධ වෙන දෙයක්. හිනිදුම පැත්තෙ, අපේ පැත්තෙ —ඔයක් තිබෙන ඕනෑම ප්‍රදේශයක— ඔය වැඩ පිළිවෙළ ඔය විධියටම යනවා. එහෙත් වී. පී. ඒ. පෙරේරා මහතා ඒ සඳහා එක්තරා වැඩපිළිවෙළක් සකස් කළා. එනම් උස් බිම් ව්‍යාපාර යෝජනා ක්‍රමයයි. අපේ ගරු ඇමතිතුමාත් ඒ ක්‍රමය පටන්ගත් කෙනෙකු වශයෙන් අප පිළිගන්නවා. උස් බිම් ව්‍යාපාර පටන් ගෙන ගම් පළල් කිරීමෙන් ලොකු සහනයක් සැලසුණා.

දිවුලපිටිය කොට්ඨාශය ගැන මට විශේෂයෙන් කියන්න පුළුවන්. එවකට මහඔය ගැලීම නිසා ගෙවල් 100, 200, 300 අවුරුද්දක් පාසා විනාශ වෙමින් තිබුණා. ඒ සැම ගෙයක් සඳහාම රුපියල් 300 බැගින් ගෙවාගෙන ආවා. ඔය විධියට ගෙවීම කරන්න බැරුව ගිය අවස්ථාවේදී මොකද කෙළේ ? උස් බිම් අරගෙන අර පවුල් ඒවායේ පදිංචි කෙරෙව්වා. මා සන්තෝෂයෙන් කියන්න කැමතියි, පසුගිය ආණ්ඩුව විසින් මේ කනගාටුදායක තත්ත්වය නැති කරන්න කුමක් හෝ වැඩපිළිවෙළක් සකස් කරන්න ඕනෑය කියා කල් පතා කර අපි සැලැස්මක් පිළියෙල කළා. ඒ හේතුව නිසාම අද මේ තරම් වැස්සත් ඒ ප්‍රදේශවල එකම ගෙයක්වත් කැඩුනේ නැහැ. අපි ඒ ගැන ඇමතිතුමාටත් ස්තුති වන්ත වෙනවා. ගරු ඇමතිතුමා බණ්ඩාරනායක ප්‍රතිපත්තිය අනුව ඒ දවස්වල කට යුතු කළ නමුත් දැන් ඒ විධියට කටයුතු කරන්නේ නැහැ. අප පසුගිය මාසයේ ගරු ඇමතිතුමාට ආරාධනා කළා, අකරගම කියන ගමට පැමිණ ඒ ප්‍රදේශයේ ගෙවල් හිඟය ගැන සොයා බලන්නය කියා. නමුත් එතුමා ආවේ නැහැ. මා කියන්නේ මේ සම්බන්ධයෙන් කුමක් හෝ සැලැස්මක් ඇති කරන්න කියායි.

වර්ෂයක් වර්ෂයක් පාසාම වර්ෂාව ඇති වෙනවා. ගරු කථානායකතුමනි, ඉඩම් වුව මනා කරන්නේ විශාල ජනගහනයක් ඉන්න ප්‍රදේශවලටයි. මුළු ලංකාවේම ජනගහනයෙන් තුනෙන් එකක් ඉන්නේ කොළඹ දිස්ත්‍රික්කයේයි. ඒ වගේම කළුතර, මාතර, ආදී මුහුදු ඈලේ තිබෙන ප්‍රදේශවලත් මේ ප්‍රශ්නය පැනනගිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වතුරෙන් යට වෙන්නෙත් මේ ප්‍රදේශයන් මයි. වැඩිපුරම ජනගහනයක් සිටින්නේ කොළඹ දිස්ත්‍රික්කයේයි. ඒ නිසා ජනගහනය අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ වැඩපිළිවෙළක් ඇමතිතුමා සකස් කරන්න. කරුණා කර ජනගහනය අනුව ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රමයක් දිසාපතිතුමාගේ මාර්ගයෙන් තමුන්නාන්සේ සකස් කරන්න. උඩරට ප්‍රදේශවල මේ ප්‍රශ්නය බලපාන අන්දම ගැන සමහර විට ගරු මන්ත්‍රීවරුන් කතා කරනවා ඇති. උඩරට ප්‍රදේශවල වුණත් සියයට දෙකහමාර වෙන්න ඉඩම් අත්පත් කර ගෙන ඒ ප්‍රදේශයේ ජනතාව අතර බෙදා දෙන්න ඕනෑය කියා ප්‍රතිපත්තියක් තිබුණා. අභාග්‍යයකට මෙන් ඒ ප්‍රතිපත්තියට මොනවා වුණාද කියා අපි දන්නේ නැහැ. ඒ ප්‍රතිපත්තියත් නැතිව ගියා. ඒ ප්‍රතිපත්තිය අනුව ක්‍රියා කළා නම් අද ඔය ප්‍රශ්න හුඟක් දුරට මගහැරී යනවා. දැන් ඔය ඩී.එම්.කේ. බල වේගය ආදී බල වේගයන් පැතිර යන්නෙත් ඔය වගේ ප්‍රශ්න නිසයි.

එදා තමුන්නාන්සේට පැහැදිලි අදහසක් තිබුණා, ඉඩම් අත්පත් කර ගැනීම ක්‍රමවත්ව කර ගෙන යාමෙන් සමාජයීය ප්‍රශ්නයත් විසඳිය හැකි වේය කියා. ගරු කථානායකතුමනි, මේ ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රශ්නය පුද්ගලයෙකුට පමණක් සීමා කර පුද්ගලයන් වශයෙන් දියුණු කිරීමේ අදහසින් පමණක් කරන දෙයක් නොවෙයි. ජනපද යෝජනා ක්‍රම ප්‍රතිපත්තිය අනුව කටයුතු කිරීමේදී බලාපොරොත්තු වන්නේ දුෂ්කර ප්‍රදේශවලට මිනිසුන් ගෙන ගොස් පදිංචි කරවීම පමණක් නොවෙයි. එහි විශාල බලාපොරොත්තුවක්, ප්‍රතිපත්තියක්, තිබෙනවා. උඩරට ප්‍රදේශවල ගැමියන්ගේ තත්ත්වය නගා සිටුවීම පමණක් නොවෙයි, උසස් තත්ත්වයකින් ජීවත් වීමට කටයුතු සලසනවා පමණක් නොවෙයි, ඒ ගැමියන්ට අයිතිව තිබුණ ඉඩම් නැවත වරක් ඔවුන්ටම ලබා දී සමාජයීය දියුණුවක් ඇති කළ යුතුය යන පරමාර්ථයෙන් යුක්තව මේ ඉඩම් අත්පත් කර ගැනීම ගැන ඇමතිතුමා කල්පනා කර බැලිය යුතුයි.

ගරු කථානායකතුමනි, මේ සෑම ප්‍රශ්නයක්ම ඉදිරිපත් කළ විට ගරු ඇමතිතුමා ඉදිරිපත් කරන තර්කයක් තමයි, සල්ලි නැත යන්න. හැමදාමත් අයවැය ලේඛනයක් ඉදිරිපත් කළ විට අපි බලන්නේ අපේ ප්‍රදේශවල තිබෙන ලොකුම ප්‍රශ්නයක් වන ඉඩම් ප්‍රශ්නය විසඳීමට කොපමණ මුදලක් වෙන් කර තිබේද කියායි. ඒ සඳහා ලක්ෂ 30 ක් වෙන් කර තිබෙන බවයි අපට පෙනෙන්නෙ. මෙය අද රටේ දැවෙන ප්‍රශ්නයක්, විශාල ප්‍රශ්නයක්. සාමාන්‍ය ජනතාවට සිදු වී තිබෙන ලොකු විපත්තියක්. උතුරු, නැගෙනහිර, කඳුරට ප්‍රදේශවල මේ තරම් විශාල ප්‍රශ්නයක් තිබියදී ගරු ඇමතිතුමා ඒ සඳහා වියදම් කිරීමට බලාපොරොත්තු වන්නේ රුපියල් ලක්ෂ 30 ක් පමණයි. මුළු අවුරුද්දටම මුළු ලංකාවටම යොදවන්නේ ලක්ෂ 30 ක් පමණයි.

ඔය හේතුව නිසා ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාට මා කරුණු වගයක් ඉදිරිපත් කළා. කොහොමද මේ සල්ලි සොයා ගන්නේ කියා මා පෙන්නා දුන්නා. ඉඩම් අත්පත් කර ගැනීමට මුදල් අවශ්‍ය වෙනවා. සමහර විට ඒ සඳහා ගෙවන්නට සිදු වෙනවා. සියයට දෙකහමාරක් වෙන්න ගෙවන්නට ඕනෑ. ඒ වගේම ඉඩම්වලට ගෙවන්න ඕනෑ. අවුරුදු 20 ක කාල සීමාවක් තුළදී ඉඩම් අයිතිකරුවන්ගෙන් ඉඩම් ගැනීමේ ප්‍රශ්නය පිළිබඳව මා ගරු ඇමතිතුමාට යෝජනාවක් ඉදිරිපත් කළා. ගරු ඇමතිතුමා මේ යෝජනාව බොහොම හොඳයි කියා මුලින් තීරණය කළාට පසු මා හිතන්නේ එතුමා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් මේ පිළිබඳව අදහස් විමසුවා. එවිට මහ බැංකුව කියා සිටියා, “ අපොයි මේ වැඩය කරන්ට එපා, මේ වැඩය කළොත් උද්ධමනයක් ඇති වෙනවා ” කියා.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

දැනට බලපවත්වන නීතිය යටතේ අවුරුදු 10 කින් ගෙවන්ට පුළුවන්.

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

ඉතින් ඒත් සල්ලි නැහැනෙ. මේ රටේ ඉඩම් අත්පත් කර ගැනීමේ හැම කටයුත් කරන්ට තියෙන්නෙ රු. ලක්ෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

30 යි. මේ මුදල වැඩි කර ගන්ට බැරිද? ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා වෙනම දෙපාර්තමේන්තුවක්ම වගේ අංශයක් ඇති කරන්නට සිදු වී තිබෙනවා. දැනටත් එතුමාගේ අමාත්‍යාංශයේ "ඉඩම් අත්කර ගැනීමේ අංශය" කියා වෙනම ලොකු කාමරයක් තිබෙන බව මා දන්නවා. ඉඩම් අත්පත් කර ගැනීම ලොකු වැඩක් බව මා පිළිගන්නවා. ගම් පළල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම පමණක් නොවෙයි, සැම කටයුත්තක් සඳහාම ඉඩම් අත්පත් කර ගැනීම් භාරව තිබෙන්නේ එතුමාගේ අමාත්‍යාංශයටයි.

ගරු කථානායකතුමනි, ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් ගෙවන මුදල් අවුරුදු 20 ක කාලසීමාවක් තුළදී ගෙවීමට වැඩ පිළිවෙලක් සකස් කරනවා නම් හොඳයි. නැබැයි අද රටේ පවතින පොලිය ගෙවන්ට ඕනෑ. මා හිතන්නේ ගරු ඇමතිතුමා ඒකට එකඟ වෙයි කියායි. මා කියන්නේ ආණ්ඩුව ගෙවන සියයට 2½ පොලිය නොවෙයි. මුදල් ගෙවීම සඳහා අවුරුදු 20 ක කාල සීමාවක් නියම කර දැනට රටේ පවතින සාමාන්‍ය පොලිය ගෙවන්නට ඕනෑ. අද බැංකු සියයට 9 ක පොලියක් අය කරනවා. දේපොළ වෙළඳ සමාගම් ආදියට 12 ක තරම පොලියක් ගෙවනවා. ඒ අන්දමට මේ ව්‍යාපාරය වෙළඳ ප්‍රතිපත්තියක් උඩ ගෙන යාමට ක්‍රමයක් සකස් කර සෑහෙන පොලියක් නියම කළොත් මේ අත් කර ගැනීමේ කටයුතු පුළුල් කරන්නට පහසු වෙනවා ඇති. ගරු ඇමතිතුමාට ඒක තනියම කරන්නට බැහැ. මේ පනතට සංශෝධන ඉදිරිපත් නොකර ගරු ඇමතිතුමාට ඒ කටයුත්ත කවදාවත් කරන්නට පුළුවන්කමක් නැහැ.

ගරු ඇමතිතුමාට මා විශාල වශයෙන් චෝදනා කරන්නේ අවුරුදු ගණනාවකට පසු ඉදිරිපත් කළ මේ සංශෝධන පනතත් සම්පූර්ණයෙන්ම කප්පාදු කර දැමූ නිසයි. අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) එයින් දෙකක් ගෙනාවා. අවසානයේදී ඉතුරු හරියත් කප්පාදු කරයි. මේ සංශෝධන පනතෙන් කිසිම ප්‍රයෝජනයක් සිදු වෙන්නෙ නැහැ. මේක කනගාටුදායක තත්ත්වයක්. අද වුණත් සංශෝධන රාශියක් ගෙනෙන්නට පුළුවන්කම තිබෙනවා. එහෙත් ඇමතිතුමාට ඕනෑකමක් නැහැ, මේ ක්‍රමය ලිහිල් කර මීට වඩා මහජනයාට සහනයක් වන විධියට මේ ප්‍රශ්න දිහා බලන්න. ඒ ගැන අපේ විරෝධය එතුමාට පළ කරන්නටයි සිදු වී තිබෙන්නේ. මේ අදහස් දෙක-තුනක් වුණත් පිළිගෙන මේ පනතට වැදගත් සංශෝධනයක් ඉදිරිපත් කළොත් අපි පනතට විරුද්ධ වෙන්නෙ නැහැ.

ගරු කථානායකතුමනි, මම එකක් කියන්නට කැමතියි. ඉඩම් අත්පත් කර ගැනීමේදී ගරු ඇමතිතුමා දිවුලපිටිය කොට්ඨාශයට විශාල සේවයක් කළා. මම හැමදාම ඔය වචනය කියනවා. මම එදත් කිව්වා; අදත් කියනවා. මගේ කොට්ඨාශයේ ගම් පළල් කිරීමේ ක්‍රමය යටතේ ඉඩම් අත්පත් කරගෙන පවුල් දහස් ගණනක් පදිංචි කරවා තිබෙනවා. ඉතින් අපි ගංවතුරින් යට වෙන්නෙ නැහැ. මානිංගමුව, අකරගම, හල්පෙ වැනි තව ගම් තුන-හතරක් පමණයි තිබෙන්නේ. ඒ ගම්වලත් අක්කර දහයෙ වගේ කුඩා ඉඩම් කෑලි ටිකක් අත් කර ගත්තාට පස්සෙ ප්‍රශ්නය ඉවරයි. ඊට පස්සෙ කොච්චර ගැලුවත් කමක් නැහැ. ඉන් පසු ගලන්න ගලන්න වාසියි. සෑම කෙනෙකුම උස් බිමකට ඇම්මට පසු මාඔය කොච්චර ගැලුවත් අපට කමක් නැහැ. ඒ නිසා ඇමතිතුමාගේ ඒ ප්‍රතිපත්තියට මා ස්තුතිවන්ත වෙනවා. එසේ ස්තුතිවන්ත වන අතරම මේ ක්‍රමය ලිහිල් කිරීමේ වැඩ කටයුත්ත, ඉඩම් ගැනීමේත් ඉඩම්වලට ගෙවීමේත් කටයුත්ත, පිළිවෙළක් ඇතිව කරන්නට ඕනෑ. දැන් ලක්ෂ 30 ක් මදි. මා හිතන විධියට ඒ ප්‍රශ්නය විසඳන්නට අඩු වශයෙන් ලක්ෂ 300 ක් වත් ඕනෑ කරනවා. එය කිරීමට ක්‍රමයක් සකස් කරන්නට ඉදිරිපත් වුණොත් විශාල සේවයක් වෙනවාය කියා මා හිතනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.50

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி. சில்வா)
(The Hon. C. P. de Silva)

ගරු කථානායකතුමනි, දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා කී අන්දමට කරන්නට මම බලන්නම්. සියලුම එල්.ඕ.ඕ. මහත්වරුන් වැඩ කරන්නේ ජී. ඒ. යටතේයි. ඒ අයට ජී. ඒ. වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ විභාග පවත්වන්නට පුළුවන්ද කියා බලන්නම්. දැන්මම ඒ බලය දෙන්නට පුළුවන්ද කියා බලන්නම්.

දෙවැනි කාරණය ගැන කියන්නට තිබෙන්නේ මෙයයි. ඉඩම්වලට ගෙවීමේ කාලය අවුරුදු 20 ක් කරන්නට කිව්වා. දැන් ගෙවන්නේ අවුරුදු දහයකින්. අවුරුදු දහයකින් අවුරුද්දෙන් අවුරුද්ද පොලියත් සමග ගෙවනවා. පොලියත් සමග අවුරුදු 10 කින් ගෙවීම දැනටමත් තිබෙනවා.

ගංවතුර ගලන ප්‍රදේශවල අය ගැන අපි දැන් කටයුතු කරගෙන යනවා. මේ ආණ්ඩුව ගිංගඟ, කළුගඟ, නිල්වලා ගඟ, ආදී ගංගා මිටියාවත්වල ඇති ගම් ගංවතුරෙන් යට වෙනවාද, නැද්ද කියා බලනවා. ඒ ගැන බලන්නට ඒජන්තවරු ගමින් ගමට යනවා. මාතර, ගාල්ල, කළුතර, කොළඹ, යන දිස්ත්‍රික්කවල දිසාපතිවරුන් සමග ඊයේ මා සාකච්ඡාවක් කළා අවුරුද්දකට වරක් දෙකක් වතුරට යට වන අය උසස් බිම්වල පදිංචි කරවීමේ ක්‍රමයක් ගැන. යට වන ගම්වල ලැයිස්තුවක් ඒජන්තවරු එවා තිබෙනවා. යට වන පවුල් ගණන ගණන් බලා තිබෙනවා ඒ අයට සුදුසු ගොඩ ඉඩම් දෙන්නට. ඒ අනුව කළු, ගිං, නිල්වලා, යන ගංගා මිටියාවත් තුනේම ඒජන්තවරුන්ගේ රෙකමදාරු අනුව සුදුසු ඉඩම් ගන්නට මා මුදල් වෙන් කළා යට වන හැම දෙනාම මිටියාවත්වලින් ඉවත් කර ගොඩ ඉඩම්වල පදිංචි කරවන්නට. හැබැයි, ඒ අයට සිත්නක් කර ඉඩම් ගන්නේ නැහැ. ගංවතුරක් ගැලූ විට උස් බිමේ ඉදිවි.

මා සන්තෝෂයි ගරු මන්ත්‍රීවරුන් මේ පනත ගැන විශේෂ උනන්දුවකින් ඉදිරිපත් කළ කරුණු—විශේෂයෙන්ම අගලවත්තෙ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) ඉදිරිපත් කළ යෝජනා—පිළිගන්නට.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පණත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, மசோதா இரண்டாம் முறையாக மதிப்பிடப்பெற்றது.

Question put, and agreed to.

Bill accordingly read a Second time.

මතු පළ වන යෝජනාව සභාසම්මත විය.

"කෙටුම්පත් පණත පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවකට පැවරිය යුතුය."—[ගරු සී. පී. ද සිල්වා.]

பின்வரும் பிரேரணை ஏற்றுக்கொள்ளப்பட்டது.

" மசோதா முழுச்சபைக் குழுவுக்குச் சாட்டப்படுமாக"—[கௌரவ சி. பி. டி சில்வா.]

Resolved :

"That the Bill be referred to a Committee of the Whole House."—[*The Hon. C. P. de Silva.*]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.

[කථානායකතුමා මූලාසනාරූඪ විය.]

முழுச் சபைக் குழுவில் ஆராயப் பெற்றது.

[சபாநாயகர் அவர்கள் தலைமை தாங்கினார்கள்.]

Considered in Committee.

[MR. SPEAKER *in the Chair.*]

1 වන වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1 ஆம் வாசகம் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

Clause 1 ordered to stand part of the Bill.

CLAUSE 2.—(*Amendment of Section 4 of Chapter 460*)

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I move,

"In page 1, leave out all the words in lines 8 to 18."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

අත් හැරීමට යෝජනා කළ වචන පනතේ කොටසක් හැටියට තිබිය යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

விடப்பட வேண்டுமென பிரேரிக்கப்பட்ட சொற்கள் மசோதாவின் பகுதியாக இருக்கவேண்டுமெனும் வினா விடுக்கப்பட்டு நிராகரிக்கப்பட்டது.

Question, that the words proposed to be left out stand part of the Bill, put, and negatived.

CLAUSE 3.—(*Amendment of Section 5 of the Principal Act*)

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I move,

'In page 1, leave out all the words in lines 19 to 23."

අත් හැරීමට යෝජනා කළ වචන පනතේ කොටසක් හැටියට තිබිය යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

விடப்பட வேண்டுமென பிரேரிக்கப்பட்ட சொற்கள் மசோதாவின் பகுதியாக இருக்கவேண்டுமெனும் வினா விடுக்கப்பட்டு நிராகரிக்கப்பட்டது.

Question, that the words proposed to be left out stand part of the Bill, put, and negatived.

CLAUSE 4.—(*Amendment of Section 38 of the Principal Act*)

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I move,

"In page 1, leave out all the words in lines 24 to 38 and in page 2, all the words in lines 1 to 8."

අත් හැරීමට යෝජනා කළ වචන පනතේ කොටසක් හැටියට තිබිය යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

விடப்பட வேண்டுமென பிரேரிக்கப்பட்ட சொற்கள் மசோதாவின் பகுதியாக இருக்கவேண்டுமெனும் வினா விடுக்கப்பட்டு நிராகரிக்கப்பட்டது.

Question, that the words proposed to be left out stand part of the Bill, put, and negatived.

CLAUSE 5.—(*Insertion of new Section 51A in the Principal Act*)

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I move,

In page 2, leave out lines 9 to 45, and in page 3 lines 1 to 29, and insert the following :

' 2. The following new section is hereby inserted immediately after section 51, and shall have effect as section 51A, of the Land Acquisition Act:

" Certain actions under this Act before any court to be given priority.

51A. (1) Where any decision, declaration or order to which this section applies, and any act or thing done under or in consequence of such decision, declaration or Order is called in question in any court whether by way of action, appeal, application in revision or any mandate in the nature of a writ referred to in section 42 of the Courts Ordinance, such court shall give the highest priority to the hearing and disposal of such action, appeal, application or mandate, and for that purpose shall ordinarily hear and dispose of such action, appeal, application or madate before all other business or cases pending or being heard or disposed of by such court.

(2) This section shall apply to any decision made under section 4, any declaration made under section 5, and any Order made under section 38.' ".

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අත් හැරීමට යෝජනා කළ වචන වගන්තියේ කොටසක් හැටියට තිබිය යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

අනිත් වචන එතැනට එකතු කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

වගන්තිය සංශෝධිතාකාරයෙන්, කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

5 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන් කෙටුම් පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

விடப்பட வேண்டுமென பிரேரிக்கப்பட்ட சொற்கள் வாசகத்தின் பகுதியாக இருக்கவேண்டுமெனும் வினா விடுக்கப்பட்டு நிராகரிக்கப்பட்டது.

அந்தச் சொற்கள் இங்கே சேர்க்கப்பட வேண்டும் எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

வாசகம், திருத்தப் பெற்றவாறு மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமெனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

5 ஆம் வாசகம், திருத்தப்பெற்றவாறு மசோதாவின் பகுதியாக இருக்கவேண்டுமென ஆணையிடப்பட்டது.

Question, that the words proposed to be left out stand part of the Clause, put, and negatived.

Question, that those words be there inserted, put, and agreed to.

Question, that the Clause, as amended, stand part of the Bill, put, and agreed to.

Clause 5, as amended, ordered to stand part of the Bill.

CLAUSE 6.—(*Insertion of a Schedule to the Principal Act*)

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I move,

"In page 3, leave out all the words in lines 30 to 45, and in page 4, lines 1 to 13."

අත් හැරීමට යෝජනා කළ වචන පනතේ කොටසක් හැටියට තිබිය යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

விடப்பட வேண்டுமென பிரேரிக்கப்பட்ட சொற்கள் மசோதாவின் பகுதியாக இருக்கவேண்டுமெனும் வினா விடுக்கப்பட்டு நிராகரிக்கப்பட்டது.

Question, that the words proposed to be left out stand part of the Bill, put, and negatived.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

කෙටුම්පත් පණත, සංශෝධන සහිතව, වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

மசோதா திருத்தங்களுடன் ஏற்றுக்கொள்ளப்பட்டதாக அறிவிக்கப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.

Bill reported with Amendments.

ගරු සී. පී. ද සිල්වා
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(The Hon. C. P. de Silva)

I move,

"That the Bill, as amended, be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පණත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, மசோதா திருத்தப்பட்டவாறு மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப் பெற்றது

Question put, and agreed to.

Bill, as amended, accordingly read a Third time, and passed.

අ. භා. 4

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! The hon. Deputy Chairman of Committees will now take the Chair.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

Are you suspending the Sitting now ?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

It was agreed that we go on till 4.30 P.M. and take the interval from 4.30 to 5.30 P.M. to enable Members to attend the funeral.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා [ජී. ජේ. පාරිස් පෙරේරා මයා.] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் [திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா] தலைமை தாங்கினார்கள்.

Whereupon MR. SPEAKER *left the Chair. and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. G. J. PARIS PERERA] *took the Chair.*

බිම් මැනීමේ හා සිතියම්ගත කිරීමේ ආයතන පනත් කෙටුම්පත

அளவையிடுதல், நிலப்படம் வரைதல் நிறுவக மசோதா

INSTITUTE OF SURVEYING AND MAPPING BILL

කල් තබන ලද විවාදය නැවත ආරම්භ කිරීමට නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [ජූනි 10].

"කෙටුම්පත් පනත දැන් දෙවන වර කියවිය යුතුය."—[ගරු සී. පී. ද සිල්වා.]

ஜூன் 10 ஆம் தேதிய வினா மீதான ஒத்திவைக்கப்பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

"மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப்பிடப்படுமாக" [கௌரவ சீ. பி. டி சில்வா]

Order read for resuming Adjourned Debate on Question—[*10th June.*]

"That the Bill be now read a Second time".—[*The Hon. C. P. de Silva.*]

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I moved the Second Reading yesterday, but I have not finished my speech.

As you know, the Survey Department had a training institute at Diyatalawa. We found that that institute, though it was an excellent one, was not able to cope with the requirements of modern times for the demand of surveyors and survey techniques. Therefore we asked for aid from the United Nations Development Programme Special Fund and we got a grant of 600,000 dollars to establish an Institute of Surveying and Mapping from the U. N. D. P. The old institute is now called the Institute of Surveying and Mapping and this institute will be better equipped and will have four U. N. experts to train the students to a much higher level than was achieved by the former School for Surveyors at Diyatalawa.

Up to 1971 we have a Project Manager, Dr. P. O. Fagerholm, a U. N. expert, and we have a Co-Manager Mr. E. M. Perera, Superintendent of Surveys. He is our man who will ultimately take over in 1971. We have three U. N. experts as lecturers, two Assistant Superintendents of Surveys as counterpart lecturers and ten senior Surveyors as instructors. After 1971 our Ceylonese staff will completely take over the whole thing. Till then we have a Manager, a U. N. D. P. expert.

Students with one year's training in Surveying and Levelling at a Junior Technical College will qualify to enter the Institute. The course of training at the Institute is of one year's duration and on completion a student would be entitled to a Diploma of the Institute.

In addition to that, we are having classes for several months to give working surveyors an in-course training in more modern survey techniques. Then they will serve all over the country.

In order to do this we have got this foreign aid and they recommend that we have an Institute of Surveying and Mapping instead of a training school as before. This Bill is for setting up that institute for training our men in surveying and mapping land.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 4.4

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

Nobody has any intention of opposing this Bill. But there are certain observations which I wish to make now that the Hon. Minister has set about creating this Institute of Surveying and Mapping. One is that the whole question of placing surveying upon a proper scientific foundation in this country was commenced really at the end of the last century at the time the Government of that day passed the Surveyors Ordinance. It would appear that all attempts that have been made since then to give proper instructions in surveying in this Island have not been successful and it has not been possible to keep surveying techniques in our country abreast of modern development elsewhere.

Therefore, out of a sense of desperation, the Hon. Minister says, Government sought aid from the United Nations, which aid has been given to the extent of $600,000. Now, is that a loan or a gift ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

A gift.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

It is a gift. This money has been provided and the Hon. Minister is seeking to create a new school of surveying, an instruction centre of surveying, with the help of certain U. N. instructors, more or less under the control of the Surveyor-General.

If you go back to the Surveyors Ordinance you will find that the Surveyor-General has to issue a licence before a person can practise, and the licensee must be a person who had passed an examination in surveying or in levelling or in surveying and levelling.

A person would be exempted from the examination if he has certain other qualifications. These qualifications are mentioned in Schedule A of the Surveyors Ordinance. Some of them are as follows :

(1) Members of the Institution of Civil Engineers, England.

(2) Members of the Institution of Civil Engineers, Ireland.

(3) Associate Members of the Institution of Civil Engineers, England.

(4) Holders of diplomas in Civil Engineering issued by any of the English, Irish, Scotch, or Indian Universities.

A number of other institutions have come into existence since the time this ordinance was passed, and it would appear that the Surveyor-General would issue a licence to a person who has had such training.

The Hon. Minister did not tell us in his speech what is defective in the present courses in regard to surveying that are available in the Island and what is going to be done with the present centres of instruction that we have. There are defects, that is why the Hon. Minister is creating this new instruction centre.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

They are going to be absorbed.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(අගලවත්ත)
(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்தை)
(Dr. Colvin R. de Silva—Agalawatta)

Into this institution ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Into our survey training school at Diyatalawa, not into the university.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I believe the universities also conduct a course.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

There are the junior universities. Students with one year's training in surveying and levelling at a junior technical college will qualfy. So this fits in.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

We are in favour of the creation of this school of training. But when you call it an Institute of Surveying and Mapping, what do you mean? An institute is not merely a place of instruction. There is the Institute of Chartered Accountants. It not merely provides courses of training to create chartered accountants; it does not merely award diplomas or certificates of some kind, which is what you are proposing to do at this institute. It has to deal with the entire question of the maintenance of proper professional standards, the enforcement of professional ethics, and, lastly, the protection of the interests of its members.

As far as these three functions are concerned, there is no provision for them in this institute that is to be set up. It is purely a teaching organization or a degree or diploma conferring body. That is all. So, you have no right to call such a body an institute.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

All that might come later.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

It is already too late. It should have been set up long ago. There is the Government Surveyors' Association and I believe, there is a private organization of some kind which has no legal status of any kind.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I am going to bring a Bill.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I am glad that we have at least elicited that much from the Hon. Minister.

Now there is a Government Surveyors' Association which was created long before the Trade Unions Ordinance, incorporated by law for the purpose of giving surveyors in Government Service a corporate status without the rights of a trade union to protect their interests and so on. It still survives.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

And is well looked after.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

Yes, well looked after. Why does not the Hon. Minister at the time he is creating this teaching body for the purpose of giving instruction to surveyors not really upgrade the Diyatalawa institution? In other words, why does he not think of creating at the same time a proper institution for the maintainence of proper profesional standards, for the enforcement of proper professional ethics, for the protection of the rights of these people?

Today surveyors have a miserable time in certain courts of law. I have the greatest respect for the judges in the minor judiciary. There have been a number of surveyors who have complained to me that they are at the mercy of somebody or other in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the district courts in regard to the manner in which surveying tasks are placed upon surveyors. Sometimes, in certain places, not everywhere —thank God, it is not everywhere— some sort of favouritism seems to operate because of the bureaucracy that mans the courts at lower levels, and they have no means of protecting themselves. They cannot complain to the judges about it, because the judges have so many other tasks placed before them. The judge cannot protect the interests of these people; and sometimes the judge himself has acquired a dislike for a particular surveyor in a particular court and therefore is reluctant to channel work in his direction. It may be so. There must be some organization which deals with problems of this kind and is able to bring matters to the notice of Government to protect the interests of these people collectively, not merely of Government surveyors, for which there is the Government Surveyors' Association, but of all surveyors in the country.

But apart from surveyors, there are levellers—not the levellers who followed Oliver Cromwell in his crime and had their heads cut off by Oliver Cromwell when they raised class issues in the course of the English revolution! These are levellers of a different kind. There are also draughtsmen within the scope of the Ordinance at different levels. There is no proper scope of instruction in regard to any of these things; no proper methods of instruction in regard to these things; no means of protecting their interests; no means of providing that those who become draughtsmen, those who become levellers, will be able to advance themselves in their careers as surveyors. These are some of the matters you could attend to.

I know that the Hon. Minister has under him in the Survey Department a large number of very efficient officers who are draughtsmen. You give them a job of surveying, and they can do it. Why not give them a training and enable them to rise in the service? There is an unfortunate battle going on within the Survey Department between draughtsmen and surveyors, field officers and so on. There appears to be some sort of conflict which never seems to be settled. These are matters that can be sorted out if, in the scheme which lays down the proper promotion prospects of all these people, a definition of their duties can be embarked upon.

I do not blame the Surveyor-General. He has got an entire setup which he has inherited as a department and which has a large number of problems within it.

I think the Hon. Minister could easily have done this if he looked upon it as a developing sector of a professional service in this country which requires much more State mediation and assistance than it has so far received. From that point of view we are glad that he is taking up this institute at least in the teaching sector. But why call it an institute? Because it is a misnomer.

ගරු සී. පී.ද සිල්වා
(கௌரவ சி. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

We want to make it an institute in due course.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பேர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

The appelation can be given when it has so graduated up to that status.

Now, in regard to the present Bill, while we are not going to oppose it, we have to point out a number of serious lacunae in the Bill. The Hon. Minister creates a person by the title of Government Project Representative. When you search through this Bill in order to find out who this Government Project Representative is, you find the definition that the Government Project Representative is no other than the Surveyor-General himself.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

Then, the Government Project Representative will be managing the institute up to 1971. After 1971 it is given over to the Surveyor-General. In other words, the Government Project Representative who is the Surveyor-General will look after it till 1971 and then give it back to himself! I do not understand why it is necessary to have this kind of Gilbertian formula for the purpose of creating an institute.

Then you have an advisory board. Now, whom is the advisory board to advise? It has to advise the Government Project Representative who will run this institute in consultation with the Project Manager. Now, look at the constitution of this board. The board is to advise the person responsible for administering the affairs of the Institute, but the board consists of the Government Project Representative and the Project Manager.

Other than those two persons, the rest of the members of the advisory board are, the Director of Foreign Aid or his representative, the Director-General of Education or his representative, Resident Representative of the United Nations Development Programme in Ceylon or his representative, the Project Co-Manager, who apparently is an understudy of the Project Manager, and not more than two members who are appointed by the Minister from persons who have wide experience and knowledge of matters relating to surveying and levelling and the functions of the institute, and who are not practising surveyors or levellers.

Now, this could have been drafted in a more intelligible way. The Government Project Representative who is the Surveyor-General has to take this over in 1971 as Surveyor-General. Why do you have these two *avatars* of the same officer? Is it necessary?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சி. பி. டி சில்வா)
(The Hon. C. P. de Silva)

We can have him as Co-Manager.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I beg your pardon, you can have a co-manager; you can have him associated in any capacity; you can give him any designation you want; you can say, "The Surveyor-General shall be the General Manager of this institute; with him will be associated the Co-Manager who is the U. N. Representative." Why all this? Government Project Representative, Project Manager, Co-Manager, all kinds of things are mentioned here.

There is one other aspect of this matter which worries me. There is nothing in this which indicates the mode of financing. The Hon. Minister told us that he is getting $ 600,000, which is a sum over Rs. 3,000,000, for the purpose of financing this institute. But the Government institute at Diyatalawa is financed out of the Consolidated Fund. That institute is to be taken over and it will probably, as a departmental matter, cease to exist; and then you will have this institute replacing it. There is nothing in this Bill which indicates the management of the finances of this organization. Who is to finance it? The Hon. Minister says he is going to get this money from the U.N., but it must be so stated in this Bill: that the financing of the activities of this institute will be from such-and-such a fund, or, from the moneys put in the Consolidated Fund and voted out, or, if you do not want to have a special vote out of the Consolidated Fund, then you must state that it shall be out of such-and-such a fund. Who is the custodian of that money? Who is going to spend that money? Who is going to keep the accounts of expenditure? Who is going to keep following up these people? Who is going to audit the accounts of this institute? Nothing is mentioned in this Bill. What is going to be the accountability in respect of the $ 600,000 gift of the United Nations? To whom is his Institute accountable?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

It is true that on the advisory board is the Director of Foreign Aid, but the Director of Foreign Aid is only a policy-making individual. He only formulates where certain aid money which comes from outside will be directed. That is his job. He is not the custodian of the fund. Who is going to be the custodian of this $600,000 ? Is it the Government Project Representative, that is the Surveyor-General in his other *avatar*, or is it the United Nations Representative ? Or is it going to be a special fund ? Or will this money be put into the Consolidated Fund and voted out ? Who will be the custodian of this money ? Who is going to authorize the disbursements out of that money ? Who will maintain the accounts of those disbursements and who will audit those accounts ? Rs. 3 million is not a small sum. There is not a word in this Bill as to how this is going to be spent, how this is going to be financed. What is the position ? I am not blaming the Surveyor-General. This Bill has been drafted with good intentions. There is not the slightest doubt about it. But there are very serious omissions in it. The Hon. Minister is proposing to spend gift money. Now who is going to be the custodian of this gift money ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

I shall reply afterwards.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பேர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

Let the Hon. Minister tell us who is going to be the custodian of this money. Who is going to audit the accounts ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

It is the co-manager who will keep accounts.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பேர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

Who is going to audit them ?

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

The Auditor-General.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பேர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

You cannot just ask the Auditor-General to audit accounts. You must legally provide for that.

ගරු සී. පී. ද සිල්වා
(கௌரவ சீ. பீ. டி சில்வா)
(The Hon. C. P. de Silva)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

තිබෙන්නේ වූ අලාභ හානි පිළිබඳව තක්සේරුවක් කිරීමට ක්‍රමයක් නැති නිසයි. මේකට යම්කිසි වැඩ පිළිවෙළක් යොදන්නට ඕනෑ. ගඩොල් පෝරණුවක් තිබුණා නම් ඒක කැඩී බිඳී ගොස් අලාභ හානි සිද්ධ වුණා නම් ඒ ගඩොල් පෝරණුව නැවත සකස් කර ගන්නට ආධාරයක් දෙන්නට ඕනෑ. නමුත් සිදුවූ අලාභය තක්සේරු කිරීමට ක්‍රමයක් නැතිකම නිසා අද මේ උදවියට කිසිම ආධාරයක් ලැබෙන්නේ නැහැ. අසුවල් තැනැත්තා ගඩොල් කර්මාන්තයෙන් ජීවත් වුණාය, ඔහුගේ ගඩොල් පෝරණුව ගංවතුරට ගහ ගෙන ගොස් තිබෙනවාය, ඔහුට ආධාරයක් දිය යුතුය කියා ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරීතුමා නිර්දේශ කරනවා නම් එවැනි තැනැත්තකුට සැලකිය යුතු ආධාරයක් දීමට වැඩ පිළිවෙලක් සකස් කරන්නට ඕනෑ. ඒ ප්‍රදේශයේ ගඩොල් කර්මාන්තයේ යෙදී සිටි ජනතාව අද මහත් විපතකට පත්ව සිටින බව මා පෞද්ගලිකව දන්නා නිසයි මේ කරුණු ඉදිරිපත් කළේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එපමණක් නොවෙයි. වැලිගම් කෝරලේ දෙනිපිටිය ආදී ප්‍රදේශවල එළවළු කොටු වවා ගෙන ජීවත් වන විශාල පිරිසක් සිටිනවා. ඔවුන් එදිනෙදා ජීවිකාව ගෙන යන්නේ එළවළු කොටුවලින් ලැබෙන ආදායමෙනුයි. රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිතුමාගේ කොට්ඨාශයේත් එළවළු කොටුවලින් ජීවත්වන විශාල පිරිසක් සිටිනවා. අද ඒ අයගේ එළවළු කොටු සියල්ලක්ම ජලයට සේදී ගොස් තිබෙනවා. එළවළු කොටුවලින් ජීවිකාව ගෙන යන උදවියට ආධාර දීමේදීත් අර මා මුලින් සඳහන් කළ ප්‍රශ්නය මතු වෙනවා. ඒ ප්‍රදේශයේ එකම එළවළු කොටුවක්වත් ඉතිරි වී නැහැ. සියල්ලම විනාශ වී ගොස් තිබෙනවා. නමුත් මේ උදවියට වූ අලාභයත් තක්සේරු කිරීමට ක්‍රමයක් නැහැ. අසුවල් කොටුවේ එළවළු තිබුණාද, වගා කර තිබුණාද, නැද්ද, අසුවල් තැනැත්තා කියන්නේ ඇත්තක්ද, බොරුවක්ද යනාදී ප්‍රශ්න මතු වෙනවා. එවැනි අවස්ථාවලදී අනුගමනය කළ හැකි ලෙහෙසිම ක්‍රමය ඒ උදවියට ආධාර දෙන්නට නොහැකිය කීමයි. එමනිසා මේ තත්ත්වයේ සිටින අය සම්බන්ධයෙන් මොකක් හරි ක්‍රමයක් සකස් කරන්නට ඕනෑ. එවැනි කර්මාන්තයක හෝ වගාවක යෙදුණු තැනැත්තකුට අලාභ හානියක් වූවා නම් ඔහුට සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ආධාරයක් ලබා දෙන්නට වැඩ පිළිවෙලක් සකස් කරන්නට ඕනෑ. අපට ලැබෙන පැමිණිලිත් දිසාපතිතුමාට ලැබෙන පැමිණිලිත් ගැන කල්පනා කර බැලුවාම බොහෝ අය එවැනි තත්ත්වයකට මුහුණ පා සිටින බව අපට පෙනී යනවා. අසුවල් තැනැත්තා ගඩොල් කර්මාන්තයෙන් නැත්නම් එළවළු වගාවෙන් ජීවත් වූ බවත් ඔහුගේ ගඩොල් පෝරණුව හෝ එළවළු කොටුව ජල ගැල්මෙන් විනාශ වී ගිය බවත් අප හොඳාකාරව දන්නවා. නමුත් ඔහුට සිදුවූ අලාභය තක්සේරු කිරීමට ක්‍රමයක් නැතිකම නිසා අද ආධාරයක් දෙන්නට නුපුළුවන් වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමාජ සේවා දෙපාර්තමේන්තුවට වර්ෂයක් පාසා මේ ආධාර දීමේ ප්‍රශ්නයට මුහුණපාන්නට සිද්ධ වෙනවා. මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ පිටාර යාමෙන් වර්ෂයක් පාසා වන විපත ගැන අප දන්නවා. නමුත් මේක නැවැත්වීමට තවම ක්‍රමයක් යොදා නැහැ. අවුරුදු ගණනාවක් තිස්සේ සාකච්ඡා කරනවා. නමුත් සුළු වශයෙන්වත් ජල ගැල්මෙන් වන හානිය වැළැක්වීමට ක්‍රමයක් යෙදී නැහැ. වර්ෂයක් පාසා සිදු වන මේ ජල ගැල්මෙන් වන හානිය වැළැක්වීමට ස්ථිර වැඩ පිළිවෙලක් යොදන්නට ඕනෑ. මක්නිසාද? ස්ථිර වැඩ පිළිවෙලක් නැතිකම නිසා සමාජ සේවා දෙපාර්තමේන්තුවට වර්ෂයක් පාසා ආධාර වශයෙන් ගෙවන්නට සිදුවූ මුදල එකතු කළා නම් ඒ මුදලින් ජල ගැල්මෙන් ස්ථිර වශයෙන්ම ආරක්ෂාවීමට වැඩ පිළිවෙලක් යොදන්නට පුළුවන්කම තිබුණා. මෙය අප දිස්ත්‍රික්කවල සිටින ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාටම සැමදාම මුහුණ පාන්නට සිදු වන කාරණයක්. ඒ නිසා මේ අවසථාවේදීවත් කල්පනා කර බලා ස්ථිර වැඩ පිළිවෙළක් යොදන්නැයි මා ඉල්ලා සිටිනවා.

තවත් කාරණයක් කියන්නට තිබෙනවා. මෙදා ජල ගැල්මේදී ජීවිත හානි ගණනාවක් ඇති වුණා. මා දැනුවත්ව ජීවිත තුනක් නැති වුණා. මාතර ප්‍රදේශයේ කුඩා ළමයින් දෙදෙනකු වතුරට ගසාගෙන ගියා. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

[පර්සි වික්‍රමසිංහ මයා.]
වාගේම මා නියෝජනය කරන කොට්ඨාශයේ කාන්තාවක් වතුරට ගසාගෙන ගොස් මරු මුවට පත් වුණා. මෙදා ජල ගැල්මේදී ඒ විධියේ ශෝකජනක සිද්ධීන් ඇති වූ අතර එවැනි තත්ත්වයකට මුහුණ පෑ පවුල්වලට විශේෂ වන්දි මුදලක් ගෙවීමට ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

නීතිය හරස් වී තිබෙන නිසා ගොවීන්ට ආධාර කරන්නට ගරු කෘෂිකර්ම ඇමතිතුමාට පුළුවන්කමක් නැති හෙයින් ඒ සඳහා සමාජ සේවා ඇමතිතුමා ඉදිරිපත් විය යුතුව තිබෙනවා. මෙම වැය ශීර්ෂය ප්‍රමාණවත් නැත්නම් තවත් වැඩිපුර මුදලක් මෙම ගරු සභාවට ඉදිරිපත් කොට අනුමත කරවාගෙන ගොවි ජනතාවට තමන්ගේ කුඹුරු නැවත වගා කර ගැනීමට ආධාර කරන ලෙස ඉල්ලා සිටිනවා. මේ වාරයේදී කුඹුරු අක්කර දොළොස් දාහක් පමණ පාළු වුණා. නැවත ඒ කුඹුරු වගා කර ගැනීම සඳහා බිත්තර වී ගන්නට ගොවීන්ට පුළුවන්කමක් නැහැ. ඒ අතර දැන් ඔවුන්ගේ කුඹුරු සැල්වීනියාවලින් පිරිලා. ඉහළ ප්‍රදේශවල තිබුණු සැල්වීනියා ගංවතුර නිසා පහත් ප්‍රදේශයට ගසාගෙන අවුත් පහත් ප්‍රදේශවල කුඹුරුවල ගොඩ ගැසී තිබෙනවා. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ කම්කරුවන් දවස් හතරක් පහක් තිස්සේ සැල්වීනියා ඉවත් කිරීමෙන් පසුවයි, බණ්ඩත්තර කියන ප්‍රදේශයේ රථවාහන ගමන් කරන්නට ඉඩ සැලසුණේ. තමන්ද සැල්වීනියා මර්දන ව්‍යාපාරයේ යෙදෙන බව ගරු කෘෂිකර්ම ඇමතිතුමා කියනවා. කෙසේ වුණත් මේ මාස් කන්නයට පෙර ඒක නොකළහොත් කුඹුරු වැඩ කරන්නට බැරි වෙනවා. මේ මාසය අවසාන වන්නට පෙර ඒ වැඩේ කරන්නට ඕනෑ. එසේ කළත් ගොවීන්ට බිත්තර වී සපයා ගැනීමේ අපහසුව තිබෙනවා. පිට පිට කන්න තුනක් ගොවිතැන් පාළු වීම නිසා බිත්තර වී දෙන්නට ගරු කෘෂිකර්ම ඇමතිතුමාට නීතිය හරස් වෙනවා. ඒ නිසා ගොවිතැන් පාළු වී කනස්සල්ලෙන් සිටින සෑම ගොවි මහතකුටම ආධාර දෙන්නට ගරු සමාජ සේවා ඇමතිතුමා ඉදිරිපත් වෙනවා ඇතැයි මා විශ්වාස කරනවා. ගොවීන්ට සිදු වී ඇති හානි ගැන කල්පනා කර බලා ඔවුන්ට බිත්තර වී ලබා ගැනීම සඳහා ආධාර දෙන්නා. එතකොට ලබන කන්නයේ ගොවිතැන් කරන්නට අවස්ථාව ලැබෙනවා. මේ කාරණා ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු වනු ඇතැයි බලාපොරොත්තුවෙන් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 6.23

එම්. එස්. අමරසිරි මයා. (හිනිදුම)
(திரு. எம். எஸ். அமரசிறி—ஹினிதும)
(Mr. M. S. Amarasiri—Hiniduma)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගංවතුරෙන් හානි සිදු වූ ප්‍රදේශයක මන්ත්‍රීවරයකු වශයෙන් මෙම වැය ශීර්ෂය සම්බන්ධයෙන් මාත් වචන ස්වල්පයක් කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. මට පෙර කථා කළ කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) කීවාක් මෙන් මේ අනුමත කරන්නට යන මුදල ප්‍රමාණවත් නැති බව මාත් කියන්නට කැමතියි. ගාලු දිස්ත්‍රික්කයට පමණක් රුපියල් පහළොස් ලක්ෂයකටත් වඩා අලාභ සිදු වී තිබෙනවා. ගංවතුර පැවති කාලයේදී සමාජ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ ගාල්ලේ දිසාපතිතුමා ඇතුළු නොයෙකුත් නිලධාරීන් ක්‍රියා කළ ආකාරය ගැන මා ඒ අයට ප්‍රශංසා කරනවා. මෙම ආණ්ඩුව බලයට පත් වුණාට පසුව මෙම ගරු ඇමතිතුමා මීට කලින් පැවති ආණ්ඩු විසින් නොදෙන ලද සහන පවා අපේ ප්‍රදේශවලට දෙන ලද බව මතක් කරන්නට කැමතියි. පෙරදී අලාභ හානි සිදු වූ ගෙයක් වෙනුවෙන් ලැබුණේ රුපියල් 300 යි. එහෙත් මේ ඇමතිතුමා පත් වුණාට පසුව 1967 දී අලාභ හානි වූ ගෙයකට රුපියල් 400 බැගින් දුන්නා. මේ වරත් ඒ වැඩි මුදලක් ලැබේ යයි අප බලාපොරොත්තු වෙනවා.

ගංවතුර විපත නිසා මගේ ආසනයේ ජීවිත හානි දෙකක් සිදු වූ බව මා ඉතා කනගාටුවෙන් සඳහන් කරන්නට ඕනෑ. ගංවතුරට කැඩී ගිය ගෙයක බඩු ගෙනෙන්නට ගිය හොඳ තරුණ ළමයෙක් මිය ගියා. ඒ වාගේම ග්‍රාමසේවක මහත්මයකුට සහාය දෙන්නට ගිය තවත් තරුණයෙක්ද සැඩ පහරට ගසාගෙන ගියා. ඒ පළාතේ ගෙවල් 600කටත් වැඩි සංඛ්‍යාවක් ගංවතුරින් විනාශ වී ගිය බව කියන්නට සිදු වී තිබෙනවා. පාරවල් සහ කම්බි පාලම් විශාල ගණනක් කැඩී යාම නිසා පළාත් පාලන මණ්ඩලවලට ඉමහත් පාඩුවක් දරන්නට සිදු වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

තිබෙන බව පෙනෙනවා. අපි මේ කාරණය පිළිබඳව පළාත් පාලන ඇමතිතුමාගේ අවධානය යොමු කරවා තිබෙනවා. ගංවතුර සහනාධාර ක්‍රමයෙන් හෝ වෙනත් යම්කිසි ක්‍රමයකින් එම ගම්කාර්ය සභාවලට ආධාර දෙන ලෙස මා මතක් කර සිටිනවා. ගංවතුරින් හානි පැමිණි ගොවි ජනතාවට දෙන සහනයක් හැටියට සමාජ සේවා ඇමතිතුමාගේ කැමැත්ත ඇතිව ගාලු දිසාපතිතුමා එක්තරා ක්‍රියා මාර්ගයක් ගෙන තිබෙනවා. එනම්, එක ගොවි පවුලකට මාසයකට රුපියල් 20 බැගින් දෙමසක් ගෙවන්නට කටයුතු යෙදීමයි. එය ඔවුනට තරමක සහනයක් සැළසෙන කාරණයක් බව කිව යුතුයි. එසේ ගොවි තැන් කළ උදවියට පමණක් නොව අල බතල කොරටු වගා කරන ලද කාටත් පාගේ මෙම සහනය සලසා දෙන හැටියට මා ඉල්ලා සිටිනවා. ඒවාගේම ගිං ගඟ දෙපසෙහි උක් වගාව කරන ගොවීන්ටත් මෙම සහනය සලසා දෙන හැටියට මා ඉල්ලා සිටිනවා.

ගිං ගඟ දෙපස වගා රක්ෂණයට යටත් නොවූ ප්‍රදේශ රාශියක් තිබෙනවා. එම ප්‍රදේශවල ගොවීන්ට මේවර ගංවතුරෙන් බරපතල අලාභහානි සිදු වී තිබෙන හෙයින් ඒ සම්බන්ධව නිසි ක්‍රියා මාර්ගයක් යෙදීම පිණිස කෘෂිකර්ම ඇමතිතුමාගේ අවධානය යොමු කරවන හැටියට මතක් කර සිටිනවා. වගා රක්ෂණයට යටත් නැති ප්‍රදේශ හැකි තාක් ඉක්මණින් වගා රක්ෂණයට යටත් කරවන හැටියට මතක් කර සිටිනවා. එයින් ගොවීන්ට සහනයක් සැළසෙනවාක් මෙන්ම සමාජ සේවා දෙපාර්තමේන්තුවටත් යම්කිසි සහනයක් සැලසෙනවා. එවිට ගෙවල් කැඩී ගිය උදවියට ආධාර දීම පිණිස එම දෙපාර්තමේන්තුවේ මුදල් ඉතිරි කර ගන්නට පුළුවනි.

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂයෙන් ගාලු දිස්ත්‍රික්කයට වෙන් කර ඇති මුදල් සියල්ල වියදම් වී අවසාන බව අප දන්නවා. ඉතා ඉක්මණින්ම එම දිස්ත්‍රික්කයට මුදල් නුදුන්නොත් ගවංතුරින් ගෙවල් කැඩී ගිය උදවියට පළමුවන ගෙවීමවත් කරන්නට අපහසු වෙනවා. 1967 දී ගංවතුරට කැඩී ගිය ගෙවල්වලට මුදල් නොගෙවූ අවස්ථා තවමත් තිබෙනවා. විශේෂයෙන් උඩුගම නැගෙනහිර සහ බටහිර ප්‍රදේශවල ගංවතුරින් කැඩී ගිය ගෙවල් සඳහා දෙවන ගෙවීම පවා දෙන්නට තවමත් බැරිව තිබෙන බව පෙනෙනවා. සමාජ සේවා අංශයේ වැය ශීර්ෂයෙන් එම කොට්ඨාශවලට වෙන් කළ මුදල් ගාලු දිසාපති කාර්යාලයට යවා නැති බව කියනවා. මේ ගැන අවධානය යොමු කර 1967 වර්ෂයේ ගංවතුරින් ගෙවල් කැඩුණු උදවියට මුදල් ලබා දෙන්නට ක්‍රියා කරන හැටියට මතක් කර සිටිනවා. එම ගෙවල් වතුරට යට වී නැවත නැවතත් කැඩී යනවා. එවැනි අවස්ථාවලදී ග්‍රාම සේවක මහතුන් විසින් කරනු ලබන රපෝර්තුවලට අනුව සමාජ සේවා නිලධාරීන් විත් පරීක්ෂා කර බලා ඒවා ප්‍රකෘතිමත් කර ගොස් තිබෙන හෙයින් එම මුදල් ගෙවන්නට අපහසු වන්නේ නැහැ. එම නිසා එම මුදල් ගෙවන්නට ඉතා ඉක්මණින්ම කටයුතු කරන හැටියට මතක් කරනවා.

සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් මෙවැනි අවස්ථාවලදී ඉතා හොඳින් කටයුතු කිරීම නිසා පළාත් වාසීන්ට විශාල සහනයක් ලැබී තිබෙන බව මතක් කළ යුතුයි. මේ ඇමතිතුමාගේ වැඩ කටයුතු කාර්යක්ෂම ලෙස කෙරී තිබෙන බව පෙනෙනවා. පසුගිය රජයේ කාලවලදී නොතිබුණු පිළිවෙළට ඉතා හොඳටත් කාර්යක්ෂම ලෙසත් වැඩ කටයුතු කිරීම ගැන අපි එතුමාට ස්තුති කරනවා. මෙම ශීර්ෂය යටතේ ඇති මුදල් ඉතා ඉක්මණින් සම්මත කර ගෙන අවශ්‍ය කරන මුදල් ලබාගෙන ගංවතුරින් අනාථ වී සිටින ජනතාවට සහනයක් සලසා දෙන්නට කටයුතු කරන මෙන් එතුමාගෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 6.29

පී. බී. විජයසුන්දර මයා. (කිරිඇල්ල)
(திரு. பீ. பி. விஜயசுந்தர—கிரியல்ல)
(Mr. P. B. Wijayasundera—Kiriella)

සමාජ සේවා ඇමතිතුමාගේ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට මා බලාපොරොත්තු වෙනවා. ප්‍රවෘත්ති පත්‍රවලින් වැඩිපුර ප්‍රසිද්ධියක් නොලැබී ගංවතුර අවස්ථාවේදී රටට විශාල සේවාවක් කරන ලද සමාජ සේවා ඇමතිතුමාටත් විශේෂයෙන් රත්නපුර සහ ගාලු දිසාපතිතුමන්ලා ඇතුළු නිලධාරීන්ටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. බී. විජයසුන්දර මයා.]

ප්‍රථමකොටම මගේ කථාවේ දී ස්තුති කරන්නට මා බලාපොරොත්තු වෙනවා. ඉතාම පැහැදිලි දර්ශනයක් ඇතුව ගංවතුර ඇති වුණ අවස්ථාවේදී ක්‍රියා කිරීම නිසා ජීවිත සහ දේපොළ බොහෝමයක් බේරා ගන්න පුළුවන් වුණා.

නියෝජ්‍ය සභාපතිතුමනි, ගංවතුර කියන දේ ඉතාම අවශ්‍ය දෙයක් බව අප පිළිගත යුතුව තිබෙනවා. ඒ මොකද ගංවතුර ගැලුවොත් තමයි අපේ වී නිෂ්පාදනය යම් මට්ටමක තබා ගැනීමට අපට පුළුවන් වන්නේ. චීනය වැනි රටවල එක් ක්‍රමයකින් ගංවතුර ලැබෙන්නට සැලැස්වීමෙන් තමයි වී අස්වැන්න වැඩි කරගෙන තිබෙන්නෙ. ඒ නිසා අප විසින් කළ යුතුව තිබෙන්නේ ගංවතුර වැළැක්වීම නොව, ගංවතුරෙන් ජීවිත හා දේපොළ ආරක්ෂා කර ගැනීමට යම් කිසි ක්‍රමයක් සැලැස්වීමයි.

මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන අවස්ථාවේදී ගරු ඇමතිතුමාට විශේෂයෙන් කරුණු කීපයක් මතක් කර දෙන්න සිද්ධ වෙනවා. එයින් ප්‍රධාන කාරණාව නම් ගංවතුරක් ඇති වූ විට රජයේ නොයෙක් දෙපාර්තමේන්තු හා නිලධාරීන් අතර සම්පූර්ණ ඒකග්‍රතා සහයෝගයක් නොලැබෙන බවයි. මෙය විශේෂයෙන්ම මා අත්දැක තිබෙන කාරණයක්. ගංවතුරක් ඇති වූ විට මෙය විශෙෂයෙන්ම අවශ්‍ය දෙයක්. නමුන්නාන්සේ දන්නවා. ගංවතුරකදී මහජනතාවට සහ දේපොළවලට සිදු වන ආපදාවලින් බේරා ගැනීම සඳහා ඔරු බෝට්ටු ආදිය තිබෙන බව. පොලීසියට ඔරු බෝට්ටු තිබෙනවා. දිසාපති තුමා යටතේ ඔරු බෝට්ටු පාලනයක් තිබෙනවා. ඒ වාගේම ගම්කායභා සභාවෙන්ද ඔරු බෝට්ටු පාලනයක් සිදු වෙනවා. මෙසේ තුන් විධියේ ඔරු බෝට්ටු පාලනයක් තිබුණත්, සමහර අවස්ථාවලදී මේ තුන් ආයතනය සහයෝගයෙන් වැඩ නොකිරීම නිසා මහජනතාවට මේ සේවයෙන් ලැබිය යුතු නියම සේවය ලැබෙන්නෙ නැති බව අපට ප්‍රත්‍යක්ෂ වී තිබෙනවා. විශෙෂයෙන් ගංවතුර අවස්ථාවේදී ඔරු පැදීමෙන් විනෝද වන්නට උත්සාහ කරන සමහර නිලධාරීන් නිසා—සියලුම නිලධාරීන් නොවෙය, සමහර නිලධාරීන් නිසා—මෙසේ සිදු වන බවයි අපට පෙනෙන්නෙ. මෙයට උදාහරණයක් වශයෙන් එක් කාරණාවක් සඳහන් කරන්න පුළුවන්. පසු ගිය ගංවතුර අවස්ථාවේදී මගේ ඡන්ද කොට්ඨාශයත් රත්නපුරේ ඡන්ද කොට්ඨාශයත් අතර පාලමක් විවෘත කිරීමට රජයේ වැඩ ඇමතිතුමාත්, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ උත්තර මන්ත්‍රීතුමියත් මාත් ගිය අවස්ථාවේදී අපට අර කී තුන් ආයතනයෙන් එකකවත් ඔරුවක් නොලැබීම නිසා පෞද්ගලික ඔරුවකිනුයි යන්න සිද්ධ වුණේ. එම ගමනේදී අපට මුහුණ පාන්නට වූ කරදර අනුව අපේ ජීවිතවලට පවා අනතුරු වෙන්නට ඉඩ තිබුණා. එවැනි තත්ත්වයක් ඇති වුණේ අර තුන්ගොල්ලන්ගෙන්ම ඔරුවක් නොලැබුණ නිසයි. එනිසා ඔරු බෝට්ටු පිළිබඳ විධිමත් පාලනයක් නැත් නම් මහජනතාවට සේවයක් කිරීම අමාරුයි. ඒ දෙපාර්තමේන්තු ගංවතුර අවස්ථාවලදී සම්බන්ධ වී ක්‍රියා කළහොත් පමණයි නිසි සේවයක් මහජනයාට ලබා දෙන්නට පුළුවන් වන්නෙ.

ගංවතුර ආපදා සම්බන්ධයෙන් ආධාර ලැයිස්තු සකස් කිරීමේදී බලය තිබෙන්නේ ග්‍රාම සේවක මහතාට පමණයි. මෙය සාධාරණයයි කියන්නට අමාරුයි. විශෙෂයෙන්ම ග්‍රාම සේවක එය කිරීමේදී සෑහෙන කාලයක් ගත වෙනවා. එම නිසා ගංවතුර සම්බන්ධයෙන් ආපදා ලැයිස්තු සකස් කිරීමේදී යම් කිසි මණ්ඩලයකින් එය සිදු වෙනවා නම් හොඳ බවයි අපේ වැටහීම. ග්‍රාම සේවක මහතා සමග ග්‍රාම සංවර්ධන සමිතියේ සභාපති, ප්‍රජා මණ්ඩලයේ සභාපති ආදී අය නිල බලයෙන් පත් වන විධියේ මණ්ඩලයක් ඇති කළොත් ඉතාම ඉක්මණින්—දින දෙක තුනකින්—ඒ ලැයිස්තු සකස් කොට නිම කර දීමට ඒ මණ්ඩලයට පුළුවන් වෙනවා. ඒ නිසා එවැනි මණ්ඩලයක් ඇති කිරීම ඉතාමත් සුදුසුයි කියා මා කල්පනා කරනවා.

තවද ගංවතුර අවස්ථාවලදී හෙලිකොප්ටර් සේවයක් ලැබෙනවා නම් එය බොහෝම අගනා සේවයක් වෙනවා. මා කියන්නේ නැහැ, හැම කොට්ඨාශයකටම හෙලිකොප්ටරයක් බැගින් දිය යුතුය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යටත් පිරිසෙයින් කච්චේරි ප්‍රදේශයකට හෙලිකොප්ටරයක් දෙන්නට පුළුවන් නම් එයින් විශාල සහනයක් සැලසෙනවා. නිකම්ම සංචාරය සඳහා නොවෙයි, ජීවිත බේරා ගැනීමට මහත් උපකාරයක් වෙනවා.

මෙහිදී මතක් කර දිය යුතු තවත් කාරණයක් නම් ගංවතුර කටයුතු සඳහා ආදායම් පාලක නිලධාරීන්ට සපයන ජීප් රථ ගැනයි. රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුරෙන් යට වන සහ වට වන කුරුවිට කෝරලේ සහ නවදුන් කෝරලේ ආදායම් කොට්ඨාශ දෙකේ නිලධාරීන් දෙන්නාටම ගංවතුර කටයුතු සඳහා සපයා තිබුණේ එකම ජීප් රථයයි. ඒ සම්බන්ධවත් කල්පනා කර මීට වඩා ඒ නිලධාරීන්ට ආධාර සැපයීම ගැන සලකා බැලිය යුතුව තිබෙනවා.

තවත් වැදගත් කාරණයක් නම් ගංවතුරක් ගැලීමේදී ගංවතුරෙන් වට වන සහ ගංවතුරෙන් යට වන පංක්ති දෙකක් සිටින බව අපේ සැලකිල්ලට යොමු විය යුතු බවයි. දැනට තිබෙන නීති රීති උඩ ගංවතුර ආධාර ලැබෙන්නේ ගංවතුරෙන් යට වන පිරිසට පමණයි. එහෙත් ගංවතුරෙන් වට වන පිරිසට ආධාරයක් ලැබෙන්නෙ නැහැ. නිත්‍ය රක්ෂාවක් නැතුව එදිනෙදා කුලී වැඩ කරමින් සිටින විශාල පිරිසක් ගංවතුරට වට වීම නිසා බලවත් පීඩාවට පත් වෙනවා. ඒ නිසා ඒ අයටත් සහනයක් ලබා දීම ඉතාමත් අවශ්‍ය කාරණයක්. සමහර අවස්ථාවලදී මධ්‍යම පංක්තියේ අය පවා ගංවතුරෙන් යට වීම නිසා ආධාර ලබනවා. එහෙත් කුලී වැඩ සඳහා යාමට බැරුව ගංවතුරෙන් වට වී සිටින අසරණ පිරිසට පිළිසරණක් සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබෙන්නෙ නැහැ. ඒ උදවිය ගැන අපි සානුකම්පිකව කල්පනා කර බැලිය යුතුව තිබෙනවා.

රත්නපුරේ දිස්ත්‍රික්කය ගංවතුර අවස්ථාවලදී නිරන්තරයෙන්ම ගංගා තුනකින් පීඩාවට පත් වෙනවා. ශ්‍රීපාදස්ථානයෙන් පටන් ගන්නා ඒ ගංගා තුනම වර්ෂාව වහින විට උතුරන්න පටන් ගන්නවා. නිරන්තරයෙන්ම වර්ෂාව පවතින විට කළුගඟ, වේ ගඟ, කුරු ගඟ යන මේ ගංගා තුනම එක වර උතුරන්න පටන් ගැනීම නිසා විශාල ගම් ප්‍රදේශ වතුරෙන් යට වෙනවා. මගේ අත්දැකීම්වල හැටියට දැනට අවුරුදු ගණනාවක සිටම ගංවතුරෙන් යටවෙන ගම්මාන 4ක් අපේ දිස්ත්‍රික්කයේ තිබෙනවා. ඒ ගම්මාන 4 හැම ගංවතුරකටම සම්පූර්ණයෙන්ම යට වෙනවා. අපේ ඇමතිතුමාත් ඒ ගම්වලට ගොස් තිබෙනවා. හකමූව—හකමූවත් මුද්දුවට අයත් ගමක්—ඇත්ඔය, මුද්දුව, යටිපහුව කියන ගම් 4 හැම ගංවතුරකටම සම්පූර්ණයෙන්ම යට වෙනවා. විශේෂයෙන්ම ඒ ගම් 4ට ගංවතුරෙන් වන හානිය වැළැක්වීමට යම්කිසි වැඩ පිළිවෙළක් යොදන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගංවතුර ආධාර දීමේ ක්‍රමයෙන් පමණක් අපට සෑහීමට පත් වෙන්න බැහැ. ඒ සඳහා විශාල මුදලක් අවුරුද්දක් පාසා වැය කරන බව ඇත්තයි. අපි මේ ගංවතුරෙන් යම්කිසි ප්‍රයෝජනයක් ලබා ගන්න ඕනෑ. යම්කිසි ප්‍රදේශයකට ගංවතුරක් ගලන විට ඒ ගංවතුරෙන් ප්‍රයෝජන ගෙන ඒ ප්‍රදේශයෙන් ලබා ගන්න පුළුවන් වී අස්වැන්න ආදිය ලබා ගන්නා අතර ඒ ප්‍රදේශවල සිටින උදවියගේ දේපොල හා ඔවුන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීමට හැකි ක්‍රමයක් ගැන අපි කල්පනා කරන්න ඕනෑ. මේ ගැන දක්ෂ විශේෂඥයන් ලංකාවේත් සිටින්න පුළුවනි. එහෙම නැත්නම් ගංවතුර ගලන රටවල සිටින—ගංවතුරෙන් ප්‍රයෝජන ගන්නා රටවල සිටින—විශේෂඥයන් හෝ කැඳවා අනාගතයට උපකාර වන අන්දමේ යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න. තාවකාලික පිළියම්වලින් පමණක් වැඩක් වන්නේ නැහැ. අනාගත දර්ශනයක් ඇතිව වැසියාට ආපදාවක් නොවන අන්දමට ගංවතුරෙන් නිසියාකාර ප්‍රයෝජනයක් ගත හැකි අන්දමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න. විශේෂයෙන්ම මේ ආපදා අවස්ථාවේදී නිශ්ශබ්දව කළ යුතු සේවය කළ ගරු ඇමතිතුමාටත්, දිසාපතිවරයාටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්ප අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 6.36

ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න
(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)
(The Hon. N. H. A. M. Karunaratna)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ දෙපාර්තමේන්තුව මගින් කරන ලද සේවය ගැන කථා කළ ගරු මන්ත්‍රීවරුන් තුන් පොළට මා පළමුවෙන්ම ස්තුති වන්ත වෙනවා. මා කියන්න කැමතියි, මීට පෙර තිබුණු වෙනත් ආණ්ඩුවලට වඩා ලොකු සේවයක් මේ ආණ්ඩුව මගින් ජල ගැලීම් ආදියෙන් විපතට පත් වූවන්ට කර තිබෙන බව. ජලගැලීම් හා වෙනත් උවදුරු සම්බන්ධයෙන් මේ ආණ්ඩුව වෙනත් ආණ්ඩුවලට වඩා වැඩ කර තිබෙන බව විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්ගේ කතාවලින්ම පැහැදිලි වෙන්න ඇති.

මා විශේෂයෙන්ම කියන්න කැමතියි, කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා පෙන්නා දුන් ආකාරයට ගාල්ල, මාතර යන ප්‍රදේශවලට ජල ගැලීම්වලින් විශාල වශයෙන් හානි සිදු වී තිබෙන බව, මාතර දිස්ත්‍රික්කයේ මෙවැනි හානිවලට ගොදුරු වූවන් නැත්නම් ජල ගැලීම් නිසා කරදරයට පත් වූ අයගේ ගණන 18,800 ක් පමණ වෙනවා. ගෙවල් 470ක් පමණ සම්පූර්ණයෙන්ම විනාශ වී තිබෙනව. අර්ධ වශයෙන් අලාභ හානි වූ ගෙවල් ගණන 760ක් පමණ වෙනවා. ඒ වගේම—ඒ මන්ත්‍රීතුමාත් පෙන්නා දුන් ආකාරයට කුඹුරු අක්කර 12 දහසක් පමණ සතයකවත් ආදායමක් ලබා ගත නොහැකි අන්දමට පාළු වී ගොස් තිබෙනවා. මේ වෙනුවෙන් මුදල්වලින් අපි දැනට රුපියල් 90,000ක් පමණ වියදම් කර තිබෙනවා. මාතර දිස්ත්‍රික්කයේ අවශ්‍යතාවන් ඉටු කිරීමට පමණක් තවත් රුපියල් 35 ලක්ෂයක් පමණ වුවමනා කරනවා. අපි දැනට කරගෙන යන වැඩ පිළිවෙළට අනුව ඒ තරම් මුදලක් අවශ්‍ය වෙනවා. විශේෂයෙන් ඔවුන් යථා තත්ත්වයට එන තෙක් යම් යම් රක්ෂාවල යෙදී සිටි අයට රුපියල් 20ක් 30ක් පමණ වන මුදලක් අපි දී ගෙන යනවා. ඒ වගේම නොමිළයේම සලාක ලබා දෙනවා. පොල්, ලුණු, සීනි, තේකොළ යනාදී සෑම දෙයක්ම සති ගණනක් යන තෙක්ම—ඔවුන් යථා තත්ත්වයට පැමිණෙන තෙක්ම—අපි ඔවුන්ට දෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් අවුරුදු ගණනාවක් තිස්සේම—යම් දවසක ආණ්ඩුවක් පිහිටෙව්වාද එදා සිට මේ දක්වාම—මාත් මේ පාර්ලිමේන්තුවට පත් වූ දා සිටම—මෙවැනි ආපදාවල් ඇති වෙනවා. කොයි ආණ්ඩුවක් බලයේ සිටියත් ජල ගැලීමක් ඇති වුණ විට විශාල කලබලයක් ඇති වෙනවා. නොයෙකුත් අන්දමට ඒ ගැන සාකච්ඡා ඇති වෙනවා. නමුත් ගංවතුර අවසාන වනවාත් සමගම ගංවතුර බැස යන්නා වාගේම ඒ සාකච්ඡාත් අහෝසි වී යනව. හරියටම පිලවුන් ගෙවල් හදන්නා වාගෙයි. වහින කාලයට පිලව් ටික එකතු වී කියනවා, දැන්වත් අපි ගෙයක් හදා ගන්නට ඕනෑය කියා. නමුත් වර්ෂාව නතර වෙනවාත් සමගම ගෙවල් හැදීමේ අදහසත් අත් හැර දමනවා. ඒ ගැන කිසිම සාකච්ඡාවක් නැහැ. අපිත් කටයුතු කර තිබෙන්නේ අන්න ඒ ආකාරයටයි.

නමුත් ඊයේ මා ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම නැති කිරීම සම්බන්ධයෙන් සී. පී. ද සිල්වා ඇමතිතුමාත් සමග සාකච්ඡාවක් කළා. මා එතුමාත් සමග කිව්වා, අපි සෑම දම මේ විධියට සාකච්ඡා කිරීමෙන් වැඩක් නැහැ. මෙයට හොඳ ප්‍රතිකර්මයක් යොදන්න ඕනෑය කියා. රුපියල් 300යේ ආධාර මුදල රුපියල් 400 දක්වා වැඩි කළා. සමහරවිට 500 කරන්නටත් පුළුවනි. එහෙත් අවුරුද්දක් පාසා රුපියල් පන්සියය හයසියය දීගෙන යනවා මිස ප්‍රශ්නය විසඳෙන්නෙ නැහැ. ඒ පුද්ගලයන්ගේ ගෙවල් ස්ථිර වශයෙන් හැදෙන්නෙ නැහැ. ගෙවල් කැඩෙනවා; ආධාර මුදල් දෙනවා. ඒ වගේම තවත් කෑම බීමත් සපයනවා. වතුරට යටවන ප්‍රදේශ ඒ විධියටම යට වී යනවා. මේ ප්‍රශ්නය ගැන අපි ඉඩම් ඇමතිතුමා සමග සාකච්ඡා කිරීමෙන් පසු එතුමා වහාම ආඥාවක් නිකුත් කළා, ගංවතුරින් අනාථ වන උදවියට බෙදා දීම සඳහා රජයට පවරා ගැනීමට යෝජනා කර තිබෙන ඉඩම් සෑම එකක්ම වහාම රජයට අත් පත් කර ගැනීමට ක්‍රියා කරන්ට කියා. තව මාස 2ක් ගත වෙන්නට පෙර ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉඩම් සියල්ලක්ම රජයට පවරාගෙන අව සාන කරයි කියා මා විශ්වාස කරනවා. මේ ඉඩම් රජයට පවරා ගැනීමෙන් පසුව දැනට ගංවතුරෙන් පීඩා විඳින පහත් බිම් වල ජීවත්වන උදවිය ඔවුන්ගේ ගම්වලින් ඈත ප්‍රදේශවල පදිංචි කරවන්නට අපේ බලාපොරොත්තුවක් නැහැ. ඒ ගම අවටම උස් බිමකින් කොටසක් ආණ්ඩුවට ලබාගෙන ඔවුන්ට ඒ ඉඩම් බෙදා දෙන අතර දැනට පහත් ප්‍රදේශවල ඔවුන් සතුව තිබෙන ඉඩම්වලත් ඔවුන්ට ඕනෑ දෙයක් කර ගන්නට ඉඩ දෙනවා. හැබැයි උස්බිම්වල අපි ගෙවල් හදා දුන්නාට පසුව ඔවුන්ගේ පහත් බිම්වල තනා තිබෙන ගෙවල් කැඩුණාට ආධාර දෙන්නේ නැහැ.

ගංවතුරෙන් විපතට පත් උදවියට ගෙවල් හදා ගන්නට තරම් වත්කමක් නැහැ කියා මා කල්පනා කරනවා. ගරු ඉඩම් ඇමතිතුමා ඒ ඉඩම් පවරාගෙන ගංවතුරින් පීඩා විඳින උදවියට බෙදා දුන්නාම ඒවායේ ස්ථිරව ගෙවල් තනා ගැනීමට අඩු වශයෙන් රුපියල් 1,000 ක් හෝ 1,500 ක් සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබා දීමට මා විශේෂ කැබිනට් පත්‍රයක් ඉදිරිපත් කරනවා. ඒ අතරම ජලයට යටවන ප්‍රදේශවල කොන්ක්‍රීට් මුක්කු හෙවත් කොන්ක්‍රීට් කනු උඩ ගෙවල් සෑදීමේ ක්‍රමයකුත් ක්‍රියාවේ යොදවන්නට අපි අදහස් කරනවා. මා හිතනවා එය තමුන්නාන්සේලාගේ සන්තෝෂයට කාරණයක් කියා. ලබන අවුරුද්ද වන විටවත් මේ ගෙවල් තැනීමේ කටයුතු ආරම්භ කර තිබුණොත් තවත් අවුරුදු දෙක තුනක් ගතවන විට මේ ආධාර දීම සඳහා වැය කරන මුදල සම්පූර්ණයෙන්ම ඉතිරි කර ගන්නට පුළුවන් වෙනවා. ගාලු ප්‍රදේශයට පමණක් මේවර අනාථාධාර සඳහා රුපියල් ලක්ෂ 6ක් අවශ්‍ය වී තිබෙනවා. මාතර දිස්ත්‍රික්කයට රුපියල් ලක්ෂ 35ක් අවශ්‍ය වී තිබෙනව. රත්නපුර දිස්ත්‍රික්කයටත් රුපියල් ලක්ෂ 2ක තරම් ප්‍රමාණයක් අවශ්‍ය වී තිබෙනවා. ඒ නිසා මේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ වැය ශීර්ෂයට එකඟ වී මෙය සම්මත කරයි කියා මා විශ්වස කරනවා.

කැළණි ගඟේ ජල ගැලීම් නතර කරන ක්‍රම ගැන කිරිඇල්ලේ ගරු මන්ත්‍රීතුමා (විජේසුන්දර මයා.) මතක් කළා. රුසියන් ආධාර ඇතිව ගඟ ඉහළ ලොකු වතුර රඳන ජලාශ බැඳීමේ යෝජනා ක්‍රමයක් තිබෙනවා. එය රුපියල් කෝටි 49ක තරම් ප්‍රමාණයක් වැය වන විශාල ව්‍යාපාරයක්. එහි කටයුතු ආරම්භ කිරීම සඳහා කැබිනට් පත්‍රයක් සකස් කරන ලෙස ගරු ඉඩම් ඇමතිතුමා ආඥාවක් දුන්න බවත් ඉතා ප්‍රීතියෙන් මතක් කරමින් මේ වැය ශීර්ෂයට තමුන්නාන්සේලාගේ සහාය ලැබෙයි කියා මා බලාපොරොත්තු වෙනවා.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල: පළාත් පාලන අමාත්‍යවරයා: කාර්මික යන්ත්‍රෝපකරණ මිළයට ගැනීම

குறைநிரப்பும் தொகை: உள்ளூராட்சி அமைச்சர் எந்திரப் பொறித்தொகுதி கொள்ளல்

SUPPLEMENTARY SUPPLY: MINISTER OF LOCAL GOVERNMENT—PURCHASE OF MECHANICAL PLANT

අ. භා. 6.44

ගරු ප්‍රේමදාස

(கௌரவ பிரேமதாச)

(The Hon. Premadasa)

මේ යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"1968 ඔක්තෝබර් 1 වැනි දායින් ආරම්භවී 1969 සැප්තැම්බර් 30 වැනි දායින් අවසන්වන මුදල් වර්ෂය තුළ සේවය සඳහා ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ ලංකාණ්ඩුවේ වෙන කිසියම් අරමුදලකින් හෝ ලංකාණ්ඩුවට සුදුස් සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ලංකාණ්ඩුව විසින් ණයට ලබාගන්නා මුදලකින් හෝ රුපියල් විසිලක්ෂයකට (රු. 20,00,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත පෙනෙන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ යුතුය :—

උපලේඛනය

ශීර්ෂය: 125—පළාත් පාලන අමාත්‍යවරයා
සම්මතයේ අංකය: 5—දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාවන්— රු.
ප්‍රාග්ධන වියදම 20,00,000

ගරු සභාපතිතුමනි, මේ රුපියල් 20,00,000 අතිරේක වැය ඇස්තමේන්තුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල්

[ගරු ප්‍රේමදාස]

මා ඉදිරිපත් කරන්නේ ග්‍රාමීය පාරවල්, පාලම් සහ ගැඹුරු ළිං තැනීම සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිළදී ගැනීමටයි. මේ සඳහා මේ මුදල් වර්ෂයේම අතිරේක වැය ශීර්ෂයක් අවශ්‍ය වී තිබෙනවා ඉක්මණින්ම මේ යන්ත්‍ර මෙහි ගෙන්වා ගෙන මා සකස් කර තිබෙන අලුත් ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට.

මේ ගෙන්වන්නට බලාපොරොත්තු වන යන්ත්‍රවලට අඩංගු ගල් රෝල්, ග්‍රේඩර් යන්ත්‍ර, බුල්ඩෝසර් යන්ත්‍ර, පොළොව කැනීමේ උපකරණ, ඩම්පර් යන්ත්‍ර, ඇළ කරන ලොරි, කොන්ක්‍රීට් ආවරණ කම්පන යන්ත්‍ර, වායු සම්පීඩක යන්ත්‍ර, ජෙනරේටර් ආදිය ගම්සභාවල පාරවල් සෑදීම, ළිං කැනීම, මාර්ග හෙළි කිරීම ආදී කටයුතුවලට අවශ්‍ය වී තිබෙනවා. මා සොයා බැලුවා—මෙතෙක් ගම්සභාවලට බර යන්ත්‍රෝපකරණ පහසුව ලැබී නැහැ. රජයෙන් අවුරුද්දකට රුපියල් එක් කෝටි දශ ලක්ෂයක වාර්ෂික ආධාර මුදලක් ගම්සභාවලට දෙනවා. ග්‍රාමීය කර්මාන්ත සඳහා ඒ මුදල ගම්සභාවලට ලැබුණු විට කොන්ත්‍රාත්කරුවන්ගේ මාර්ගයෙන් ඒවා කරවා ගන්නට ගම්සභාවලට සිදු වෙනවා. ඒ ප්‍රදේශවල සිටින ඒ වැඩ බාර ගන්නා කොන්ත්‍රාත්කරුවන්ට අවශ්‍ය උපකරණ නැත්නම් යන්ත්‍රෝපකරණ ඇත්තේ නැහැ. ඒ නිසා ඔවුන් කරන ඒ කර්මාන්තවලින්, වැය කරන මුදලට සරිලන ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ. මේ ගෙන්වන්නට යන යන්ත්‍ර ගම්සභාවල ප්‍රයෝජනයට දෙන්නට මා බලාපොරොත්තු වෙනවා, එක් අතකින් ආධාර මුදලුත් දීලා. ඒ ගම්සභාවලට ඊළඟට පුළුවන්කම ලැබෙනවා අපේ ඉංජිනේරු මහත්වරුන්ගෙන් ඒ යන්ත්‍ර සේවයට ලබා ගන්නට. අප දෙන ආධාර මුදලෙන් සුළු මුදලක් ගෙවන්නට වේවි. කුමක් සඳහාද කියනවා නම් මා භාණ්ඩාගාරයෙන් අවසර ලබාගෙන තිබෙනවා "ඇඩ්වාන්ස් එකවුන්ට්" කියා ඒ මුදල් තැන්පත් කර යන්ත්‍ර අලුත්වැඩියා කිරීම ආදිය සඳහා යොදවන්නට. එසේ වූ විට විශාල මුදලක් ඉතිරි කර ගන්නට ගම්සභාවලට පුළුවන් වේවි. එසේ ඉතිරිකර ගන්නා මුදලින් පාරවල් හැදීම ආදී කර්මාන්ත කටයුතු දීර්ඝ කරන්නටත් පුළුවන් වේවි.

කොන්ත්‍රාත්කරුවන්ට යම් කොන්ත්‍රාත්තුවක් දෙන විට විශාල මුදලක් අපතේ යනවා. සමහර තැන්වල නොයෙක් කොමිස් තබා ගන්නවා. සියයට 10 කියන එක බොහොම ප්‍රසිද්ධ එකක්. පාරකට රුපියල් 10,000 ක් දුන්නාම ඒ පාරට රුපියල් දාහක දෙදාහක දෙයක් වත් කෙරෙනවාය කියා මා හිතන්නේ නැහැ. එහෙත් හැම පළාත් පාලන සහකාර කොමසාරිස්වරයකුගේම මධ්‍යස්ථානයකට මේ ග්‍රේඩර් යන්ත්‍ර ආදිය සපයන්නට පුළුවන් වුණොත් වියදම් කරන මුදල හුඟක් දුරට ඉතිරි කර ගන්නට පුළුවන් වෙනවා පමණක් නොවෙයි, මුදල් මදිය කියා ගම්සභාවලින් අපට චෝදනා එන එකකුත් නැහැ. එයට හේතුව ඒ මුදල් ප්‍රමාණවත් වීමයි. මේ යන්ත්‍ර පහසුකම් දුන්නොත් දැනට 10,000 කින් කරන වැඩක් එයින් අඩකින් පමණ කරන්නට පුළුවන් වෙනවා.

බිබිලේ ආසනයේත් මුල්කිරිගල ආසනයේත් මේ බර යන්ත්‍ර පාවිච්චි කර ලබාගෙන තිබෙන දියුණුවක් දකින්නට මට පුළුවන් වුණා. ඒ ප්‍රදේශයේ ගම්සභා ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයෙන් ලොකු යන්ත්‍ර ලබාගෙන කටයුතු කිරීම නිසා වෙනද හදනවාට වඩා වැඩි දුර ප්‍රමාණයක් පාරවල් එම මුදලින්ම හද ගන්නට පුළුවන් වී තිබෙනවා. එය ඒ කොට්ඨාශ දෙකේ මන්ත්‍රීවරුන් දෙපොළයි මට පෙන්වා දුන්නේ. හුඟක් කල් පවතින විධියට ග්‍රේඩර් යන්ත්‍ර මඟින් පාරවල් සකස්කර ගන්නට පුළුවනි. ගම්සභාවලට ගල්රෝල් ලබා ගැනීම බොහොම අමාරුයි. රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙන් හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඒවා ලබා ගැනීම දුෂ්කර වන අතර, පෞද්ගලික උදවියගෙන් ඒවා ලබා ගන්නට නම් විශාල මුදලක් ගෙවන්නට සිදු වෙනවා. පාරවල් තළන නවීනතම යන්ත්‍ර 5 ක් අමාත්‍යාංශය මඟින් දැනටමත් ගෙන්වා තිබෙනවා. එසේම තවත් 3 ක් ගෙන්වන්නට නියම කර තිබෙනවා. මේ අනුව බලන විට, ග්‍රේඩර් හා බුල්ඩෝසර් වැනි යන්ත්‍ර ගම්සභාවලට ලැබීමෙන් විශාල ප්‍රයෝජනයක් සැලසෙනවා. තවත් යන්ත්‍ර ලබා ගැනීම සඳහා මීළඟ අයවැය ලේඛ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නයේ මුදල් වෙන් කර තිබෙනවා. අය වැය ලේඛනයක් ඉදිරිපත් කරන්නට ඔන්න මෙන්න කියා තිබියදී අතිරේක වැය ශීර්ෂයක් ඉදිරිපත් කිරීමට අවකාශ සැලසීම ගැන විශේෂයෙන් මුදල් ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. රජය ගම්සභා ප්‍රදේශවල සංවර්ධනය කෙරෙහි දක්වන සැලකිල්ල එයින්ම පෙනෙනවා.

රුපියල් 1,000, 1,500, 2,000, 2,500 ආදී වශයෙන් ළිං කැනීම සඳහා ආධාර මුදල් දෙන බව අප කවුරුනුත් දන්නවා. මේ ළිං පිළිබඳ ප්‍රශ්නය වියළි කලාපයේ ඉතාම දරුණු ප්‍රශ්නයක්ව පවතිනවා. නියං කාලයේදී ඒ ළිංවල වතුර කොහෙත්ම නැහැ. දෙන සුළු මුදලින් ගැඹුරු ළිං කනින්නවත් පුළුවන්කමක් නැහැ. පොළොව කැනීමට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ගෙන්වා ගත්තාම ළිං කැනීම සඳහාත් ඒවා පාවිච්චි කරන්නට පුළුවනි. කැලෑ එළි කර පාරවල් තනන්නටත් මේ යන්ත්‍රවලින් පුළුවන්කම ලැබෙනවා.

එසේම අමාත්‍යාංශය යටතේ ග්‍රාමීය පාරවල් සහ පාලම් අංශයක් පසුගිය ජනවාරි 3 වැනි දා ගරු අගමැතිතුමා ලවා විවෘත කළා. ඊට අවශ්‍ය යන්ත්‍රෝපකරණත් මේ අතිරේක ඇස්තමේන්තුවල අඩංගු වෙනවා. හැම ගම්සභාවකටම අඩු වශයෙන් එක පුවිටු පාළම බැගින්වත් දෙන්නට අප අදහස් කරනවා. දැනටමත් පුවිටු පාළම් සීයක් හදා තිබෙනවා. දැන් ඒවා සවි කරගෙන යනවා.

පළාත් පාලන ආයතනවලින් නඩත්තු කරන ග්‍රාමීය පාරවල්—අතු පාරවලුත් සමග—සැතපුම් 41,000 ක් තිබෙනවා. මෙයින් වාහන යන්නට පුළුවන් තරමේ පාරවල් සැතැපුම් 13,000 ක් තිබෙනවා. අපේ ප්‍රසිද්ධ පාරවල් නියම අන්දමට සකස් කර ගන්නවා වාගේම අපේ ග්‍රාමීය පාරවලුත් සකස් කරගෙන හොඳින් පවත්වාගෙන යාම, කෘෂිකාර්මික හා කර්මාන්ත දියුණුවට ඉතාමත් අවශ්‍ය දෙයක් බව අප කවුරුනුත් පිළිගන්නවා. එම නිසා රුපියල් 20,00,000 යේ මේ අතිරේක වැය ශීර්ෂය අනුමත කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப் பெற்றது.

Question proposed.

අ. භා. 6.52

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා

(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)

(Mr. Deputy Chairman of Committees)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත්වූයෙන් නියෝජ්‍ය කථානායකතුමා [එම්. සිවසිතම්පරම් මයා.] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் அக்கிராசனத்திலிருந்து நீங்கவே, உபசபாநாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.

Whereupon Mr. Deputy Chairman of Committee left the Chair, and Mr. Deputy Speaker [MR. M. SIVASITHAMPARAM] took the Chair.

පර්සි වික්‍රමසිංහ මයා.

(திரு. பேர்சி விக்கிரமசிங்ஹ)

(Mr. Percy Wickremasinghe)

නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු ගණනාවක් මුළුල්ලේ මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් විසිනුත්, ගම්සභාපතිවරුන්ගේ සම්මේලනවලිනුත් කළ ඉල්ලීමක් ඉෂ්ට කිරීම සඳහා පළාත් පාලන ඇමතිතුමා අද වැය ශීර්ෂයක් ඉදිරිපත් කිරීම ගැන මා ඉතාමත්ම සන්තෝෂ වෙනවා. මේ වැය ශීර්ෂයෙන් කරන්නට බලාපොරොත්තු වන දේවලින්, ගම්සභාවල කටයුතු කිරීමේදී අපට මුහුණ පාන්නට සිදු වුණු දුෂ්කරතා රාශියක් නිරාකරණය කර ගන්නට පුළුවන්කම තිබෙනවා.

අවුරුදු ගණනාවක් ගම්සභාපතිවරයකු වශයෙන් කටයුතු කොට ලත් පළපුරුද්ද අනුව මා දන්නවා, පාරවල් හා ළිං ආදිය සකස් කිරීමේ කටයුතු සඳහා කොන්ත්‍රාත් දීමේදී සිදු වන දේවල්. ඇමතිතුමා කීවා වාගේම, රජයෙන් වෙන් කරන සම්පූර්ණ මුදල ඒ කටයුතු සඳහා වැය වන්නේ නැහැ. කොමිස් වෙනුවෙනුත් වෙනත් නොයෙක් නොයෙක් දේවල් වෙනුවෙනුත් වැය කිරීම සිරිතක් හැටියට කෙරෙනවා. ගම්කාර්ය සභාවල් මේ තත්ත්වයට මුහුණ පා සිටින්නේ අවශ්‍ය උපකරණ නැතිකම නිසයි. ගරු ඇමතිතුමා ඒ ඒ ප්‍රදේශවල සංචාරයේ යෙදුණු අවස්ථාවල ගම්කාර්ය සභාවල නියෝජිතයන් විසින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

එතුමාට මේ කාරණය පෙන්වා දී තිබෙනවා. පාරවල් තැනීමට ගන්නා රෝලර් වැනි උපකරණ රජයෙන් ගෙන්වා යම් යම් මධ්‍යස්ථානවල ප්‍රාදේශීය උප කොමසාරිස්වරුන් භාරයේ තැබීමෙන් ඒවා අවශ්‍ය අවස්ථාවලදී ඒ ඒ ගම්කාර්ය සභාවට ලබා ගන්නට පුළුවන්කමක් ඇති වෙනවා. ඒ සඳහා යම් මුදලක් වැය කරන්නට සිදු වුවත් එහි කිසිම වරදක් නැහැ. උපකරණ අලුත්වැඩියා කිරීම වැනි කටයුතු සඳහා වියදමක් දරන්නට සිදු වන බව පිළිගත යුතුව තිබෙනවා.

ගම්කාර්ය සභාවක් කොයි තරම් උනන්දුවෙන් වැඩ කළත් අද සාර්ථක ප්‍රතිඵල ලබන්නට බැහැ. හැතැප්ම භාගයක් නැත්නම් හැතැප්මක් තරම් වූ පාරක් වුවත් කළු ගල් දමා තාර දමා සකස් කරන්නට ඇතැම් ගම්කාර්ය සභා මැලිකමක් දක්වන්නේ ඒ වැඩ කොටස කොන්ත්‍රාත්කරුවකුට භාර දුන්නත් කොන්ත්‍රාත්කරුට මුහුණ පෑමට තිබෙන කරදර නිසා ඒ කාර්යය හරියාකාර කර ගන්නට නොහැකි වන නිසයි. කොන්ත්‍රාත්කරුට අවශ්‍ය ගල් රෝලර් ආදිය සොයා ගැනීම අමාරුයි. මා නියෝජනය කරන, සභාපතිවරයා හැටියට මා කටයුතු කරන ගම්කාර්ය සභාවට අයිති හැතැප්ම භාගයක් තරම් වූ පාරකට කළු ගල් දමා තාර ඇමීම සඳහා ටොන් අටක් බර රෝලර් පාවිච්චි කළ යුතුයයි වැඩ පරිපාලක මහත්මයා කියනව. ඒ අනුව ඇස්තමේන්තුත් සකස් කරනවා. ටොන් අටක රෝලරයක් සොයා ගන්නට කොන්ත්‍රාත්කරුට පුළුවන්කමක් නැති බව මම දන්නවා. නගර සභාවෙත් තිබෙන්නේ ටොන් පහේ රෝලර් පමණයි. ඔය තත්ත්වය යටතේ කොන්ත්‍රාත්කරුවා වැඩ කරන්නේ කොහොමද ? අන්තිමේදී ටොන් පහේ රෝලරයෙන් තළා පාර සකස් කර ඇස්තමේන්තුව අනුමත කරවා ගන්නවා මිස වෙන කළයුතු දෙයක් නැහැ. ගම්කාර්ය සභාවලට ඔය වාගේ තත්ත්වයන්ට මුහුණ පාන්නට සිද්ධ වෙනවා.

ගොඩනැගිලි තැනීමේදීත්, පාරවල් තැනීමේදීත් විශාල ගල් ඉවත් කර දැමීමට ක්‍රේන් යන්ත්‍ර ආදිය නැති නිසා වැඩ ප්‍රමාද වෙනවා. මෙවැනි හේතු නිසා සිදු වන්නේ කුමක්ද ? මුදල් වර්ෂය අවසන් වන්නට මත්තෙන් වැඩ අවසන් කරන්නට එකම ගම්කාර්ය සභාවකටවත් පුළුවන්කමක් ඇති වන්නේ නැහැ. ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ මේ යෝජනාව අනුව වැඩ පිළිවෙළ සකස් කිරීමෙන් ඔය කරදර සියල්ලක්ම ඉවත් වෙනවා. ඒ නිසා අවශ්‍ය උපකරණ ආදිය ගම්කාර්ය සභාවලට ලබා ගැනීමට ඉතාමත් ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වැඩ පිළිවෙළ මෙන්න මේ ආකාරයට සකස් කළ යුතුයයි මම කියන්නේ නැහැ. ගරු ඇමතිතුමා පළාත් පාලනය ගැන මනා පළපුරුද්දක් ලබා ඇති කෙනකු නිසා මේ සම්බන්ධයෙන් හොඳ අවබෝධයක් එතුමාට තිබෙනවා. ඒ නිසා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කිරීම එතුමා අනුමත කරන අන්දමට කෙරෙනු දකින්නට අපි බලාපොරොත්තු වෙනවා.

උපකරණ ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙනුත් ගරු ඇමතිතුමා විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරනු ඇතැයි අපි අපේක්ෂා කරනවා. ජාවාරම්කාරයන්ගෙන් ආරක්ෂා කර ගන්නා වැඩ පිළිවෙළක් වුවමනා කරනවා. රජයෙන් උපකරණ ලැබෙන විට ඒ උදවියට ලැබෙන ලාභය අඩු වන නිසා නොයෙක් විධියේ උපක්‍රම යොදා යන්ත්‍ර ආදිය සම්පූර්ණයෙන්ම ක්‍රියා විරහිත කිරීමටත් ඔවුන් වැඩ පිළිවෙළ යොදන්නට පුළුවනි. ඒ සඳහාත් ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් සකස් කරන අතරම ගම්කාර්ය සභාවලට කලට වේලාවට යන්ත්‍ර ලබා ගැනීමට පහසුකම්ද ඇති කරන මෙන් ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. එසේ නොකරතොත් ගරු ඇමතිතුමා ගන්නා ප්‍රයත්නයේ නියම ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන්කමක් ඇති වන්නේ නැහැ.

රජයේ ඇතැම් දෙපාර්තමේන්තුවලටත්, සංස්ථාවලටත් සපයා තිබෙන යන්ත්‍ර ආදිය බොහෝ තැන්වල වැස්සට තෙමී තෙමී, අව්වට වේලි වේලී තිබෙන ආකාරය අපට දකින්නට ලැබෙනවා. එයින් සිදු වන මුදල් නාස්තිය ආදිය ගැන කල්පනා කරන්නට ඕනෑ. යන්ත්‍ර ආදිය ලබා දීම ඉතා වැදගත් දෙයක් හැටියට අපි සලකනවා. උඩරට ගැමි කොමිසම යටතේ පාරවල් සකස් කරන ප්‍රදේශවල පාරවල් සකස් කිරීම සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොයෙක් විධියේ යන්ත්‍ර පාවිච්චි වෙනවා. එවැනි තත්ත්වයක් අනෙක් පළාත්වල නැහැ. ගරු ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාවෙන් ඒ තත්ත්වය නැති වෙනවා. එසේ වූ විට කලට වේලාවටත්, වුවමනා හැටියටත් යන්ත්‍ර ලබා ගැනීමට පුළුවන් වෙනවා. එවැනි උදාර සේවයක් ලබා දීම සඳහා ගරු ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙන මේ වැය ශීර්ෂයට පමණක් නොව ගම්බද ජනතාවගේ තත්ත්වය උසස් කිරීම සඳහාත්, ගම් සංවර්ධනය කිරීම සඳහාත්, ගම් කාර්ය සභාවල වැඩ කටයුතු දැනට වඩා පහසුවෙන් කිරීම සඳහාත් ගරු ඇමතිතුමා තව තවත් වැය ශීර්ෂ ඉදිරිපත් කළොත් ඒවාට අපේ සම්පූර්ණ සහයෝගය දෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 6.59

පී. බී. එම්. හේරත් මයා. (වලපනේ)
(திரு. ரி. பி. எம். ஹேரத்—வளப்பனை)
(Mr. T. B. M. Herath—Walapane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගම් සභාවල මෙතෙක් පැවති විශාල අඩුපාඩුවක් සම්පූර්ණ කිරීමට වැය ශීර්ෂයක් මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී ගම්සභාපතිවරයකු හැටියට මගේ ප්‍රීතිය ප්‍රකාශ කළ යුතුය කියා මා කල්පනා කරනවා. පසුගිය දිනවල නුවර එළියේ පැවති ගම්සභාපතිවරුන්ගේ සාකච්ඡාවේදී නුවරඑළි දිස්ත්‍රික්කයේ ගම් සභාපතිවරුන් ගරු පළාත් පාලන ඇමතිතුමාට පෙන්නුම් කළ අඩුපාඩු අතර විශාලම අඩුපාඩුව වශයෙන් දක්වූයේ මේ කාරණයයි. පාරවල් සකස් කරන රෝලක් කොහෙත්ම සොයා ගත නොහැකි නිසා නුවරඑළි දිස්ත්‍රික්කයේ ගම්සභා පාරවල් එකක්වත් හදන්නට පුළුවන්කම නොතිබුණු බව එතුමාට පැමිණිලි කළා. වැඩි අමාරු ප්‍රදේශවල නොවෙයි, රාගල නගරයේ තිබුණු පාර පවා අවුරුදු ගණනාවක් තිස්සේ කැඩී සාදන්නට නොහැකිව තිබෙනවා, පාර තලන රෝලක් සොයා ගන්නට බැරිකම නිසා. මුදල් තිබුණත්, කොයි තරම් මහන්සි ගත්තත් උපකරණ නැති නිසා වැඩ කරන්නට බැහැ. ගම්සභාවල මේ අඩුපාඩුව පියවීම සඳහා රජය ගෙන තිබෙන පියවර ඇත්ත වශයෙන්ම ප්‍රශංසනීය බව ගම්සභාපතිවරයකු හැටියට මා මතක් කළ යුතුයි.

පරිපූරක මුදල්

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාරවල් සකස් කරන උපකරණ සම්බන්ධව පමණක් නොව වෙනත් උපකරණ කීපයක් ගැනත් එතුමාගේ අවධානය යොමු කර තිබෙනවා. මා හිතන හැටියට ගරු ඇමතිතුමාට මේ උපකරණ තෝරා ගැනීමේදී තවත් අංශයක් ගැන මතක් කරන්නට තියෙනවා. විශාල ජල නළ සහ කුඩා ජල නළ සවි කිරීම සඳහා අවශ්‍ය උපකරණ මේ ලැයිස්තුවේ නැහැ.

ගරු ප්‍රේමදාස
(கௌரவ பிரேமதாச)
(The Hon. Premadasa)

අයවැය ලේඛනයෙන් ඒ ගැන කටයුතු කරනවා.

පී. බී. එම්. හේරත් මයා.
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

මතක් කිරීමක් වශයෙනුයි මා කීවේ. ගරු ඇමතිතුමා ආරම්භ කළ කටයුත්ත තව තවත් පළල් කරමින් ගම්සභාවලට පමණක් නොව සුළු නගරසභා, පළාත් ආණ්ඩුසභා, නගරසභා ආදියටත් පාවිච්චි කළ හැකි උපකරණ සැපයීමෙන් පළාත් පාලන ආයතනවලින් ඉතාමත් ප්‍රයෝජනවත් සේවයක් කිරීමට අවස්ථාව සලසනවා ඇතැයි අප බලාපොරොත්තු වෙනවා. රජයේ ෆැක්ටරියේත්, රජයේ වැඩ දෙපාර්තමේන්තුවෙත් යන්ත්‍ර පාවිච්චි කරන ආකාරයට මේ යන්ත්‍රත් පාවිච්චි කරන්නට ගියොත් මේකත් තවත් සුදු අලියකු බවට පත් වන්නට ඉඩ තිබෙනවා. වලපනේ පාර තලන රෝලර් එකක රේසර් එක කැඩී එය හදන්නට අවුරුදු 4 ක් ගත වුණා, රජයේ ගබඩාවට. මේකත් ඒවාගේ තත්ත්වයකට පත්වන්නට ඉඩ දෙන්න එපා. දැන් සිටම ක්‍රමවත් සැලැස්මක් උඩ පාලනය ගෙන යන්නට පුළුවන් ආකාරයට කටයුතු සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. විශාල මුදලක් වියදම් කර ගෙන්වන යන්ත්‍ර නිසි පරිදි පාලනය වන්නට ඕනෑ, ඒවායින් ගත හැකි වැඩ ගන්නට. අද රජයේ වැඩ දෙපාර්තමේන්තුව වැනි දෙපාර්තමේන්තුවල තිබෙන යන්ත්‍ර සූත්‍රවලින් රටට ප්‍රයෝජනයක් ගන්නට බැහැ. එවැනි තත්ත්වයකට මෙය පත් වුණොත් අද මේ ගැන සන්තෝෂ වන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. බී. ඇම්. හේරත් මයා.]

අපට ඉහට අනිද්දා වන විට කණගාටු වන්නට සිදු වෙනවා. එම නිසා, ගරු ඇමතිතුමා ආරම්භ කළ කටයුත්ත පවත්වාගෙන යා හැකි ක්‍රමවත් සංවිධානාත්මක වැඩ පිළිවෙලක් යොදන ලෙස මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 7.4

හේමචන්ද්‍ර සිරිසේන මයා. (අකුරණ පළමුවන මන්ත්‍රී)
(திரு. ஹேமச்சந்திர சிரிசேன—அக்குறனை முதலாம் அங்கத்தவர்)
(Mr. Hemachandra Sirisena—First Akurana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගම් කාර්ය සභා සංවර්ධන කටයුතු සඳහා යන්ත්‍ර සූත්‍රවල අවශ්‍යතාව දැන් බොහෝ කාලයක් තිස්සේ පවතින්නක්. මේ පිළිබඳව මෙම ගරු සභාවෙහිදීත් ගම්සභා නගර සභා සම්මේලනවලදීත් නොයෙක් වර කරුණු හා ඉල්ලීම් ඉදිරිපත් වී තිබෙන බව ඒ පිළිබඳ වාර්තාවලින් අපට හොඳ හැටි පෙනී යනවා. ප්‍රමාද වී වුවද, මේ කාර්මික යන්ත්‍ර සූත්‍ර ලබා දීමට ගරු ඇමතිතුමා ගත් උත්සාහයත් දක්වන උනන්දුවත් ගැන අප එතුමාට ස්තුති කළ යුතුයි. මෙහිදී අප සෑම කරුණක් ගැනම විරුද්ධව කථා කරනවා නොවෙයි. රටට ගැළපෙන අවශ්‍යතාවන් පිරිමැසීමට ඉදිරිපත් කෙරෙන මෙවැනි වැය ශීර්ෂ සඳහා සෑම විටම අපගේ සහයෝගය ලැබෙන බව අවංකව ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. පළාත් පාලන දේශපාලනයේ දීර්ඝ කාලීන පළපුරුද්දක් ඇති ගරු ඇමතිතුමා එහි අවශ්‍යතාවන් තේරුම් ගෙන තිබීම ගැන අපගේ ප්‍රසාදය මේ අවස්ථාවේදී පළ කරනවා. මීට පෙර මෙවැනි යන්ත්‍ර සූත්‍ර තිබුණා නම්, අද ගම්සභා නගර සභා ආදියෙහි අතපසු වී තිබෙන වැඩ කටයුතු නිමාවට පත් කර ගන්නට තිබුණා.

පළාත් පාලන ආයතනවල යම් යම් වැඩ කටයුතු සඳහා පළාත් පාලන අමාත්‍යාංශයෙන් දෙන මුදල්, එම කටයුතු කර ගන්නට ඒ පළාත් පාලන ආයතනවලට බැරි වීම නිසා අවුරුදු ගණන් වැඩට නොගෙන තැන්පත් වී තිබෙන බව ගරු ඇමතිතුමා දන්නවා ඇති. එසේ වන්නේ අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නැති නිසයි. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවෙන් ඒවා ලබා ගැනීමේදී ඇති අමාරුකමත් එහි පවතින යන්ත්‍ර සූත්‍ර හිඟයත් මා මෙහිදී විස්තර කරන්නට වුවමනා නැහැ. එම නිසා, මේ වැය ශීර්ෂයෙන් ඉල්ලා තිබෙන 20 ලක්ෂයේ මුදල සෑහේ යයි අපට සතුටු වන්නට බැහැ. අයවැය විවාද අවස්ථාවේදීවත් මීට වැඩි වියදමක් මේ කටයුතු සඳහා යොදවා, වලපනේ ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන් ජල නළ හා අවශ්‍ය වෙනත් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සපයා ගැනීමට කටයුතු යොදනැයි අප බලාපොරොත්තු වෙනවා.

මෙහිදී මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්නට කැමතියි. මෙම යන්ත්‍ර සූත්‍ර බෙදා දීමේදී දේශපාලන හිතවත්කම් අනුව ප්‍රමුඛස්ථානය දීමේ පිළිවෙලක් ඇති නොකර, යම් පළාත් පාලන ආයතනයක දේශපාලන බලය කුමක් වුවත් එහි අවශ්‍යතා අනුව සාධාරණ ලෙස මේවා බෙදා හැරීමට පළාත් පාලන උප කොමසාරිස් තුමාට නියෝග කරන හැටියට මා ඉල්ලා සිටිනවා. මා මීට වඩා කථා කරන්නට අදහස් කරන්නේ නැහැ. ගරු ඇමතිතුමා මේ කාර්යය සඳහා දරන උත්සාහයත් දක්වන සැලකිල්ලත් ගැන, ගම්කාර්ය සභා දේශපාලනයේ සෑහෙන පළපුරුද්දක් ඇති මා ගරු ඇමතිතුමාට ස්තුතිය පුද කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு, நிராகரிக்கப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල: මුදල් අමාත්‍යාංශය: තේ අපනයන තීරු බදු ප්‍රතිදාන යෝජනා ක්‍රමය

குறைநிரப்புத் தொகை: நிதி அமைச்சு: தேயிலை ஏற்றுமதித் தீர்வை தள்ளுபடித் திட்டம்

SUPPLEMENTARY SUPPLY: MINISTRY OF FINANCE: TEA EXPORT DUTY REBATE SCHEME

අ. භා. 7.08

ගරු වන්නිනායක (මුදල් ඇමති)
(கௌரவ வன்னிநாயக்க—நிதி அமைச்சர்)
(The Hon. Wanninayake—Minister of Finance)

I move,

"That a supplementary sum not exceeding Rupees Eighteen million five hundred thousand (Rs. 18,500,000) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on October 1, 1968, and ending on September 30, 1969, and that the said sum may be expended as specified in the Schedule hereto:—

Schedule

	Rs.
Head 47—Miscellaneous Services	
Vote No. 2—Administration Charges—	
Recurrent Expenditure	18,500,000 "

The Tea Export Duty Rebate Scheme under which a part or whole of the export duty of 35 cents per pound was refunded on low priced teas as an interim measure of assistance to the producers was introduced on 25th September 1966, and continued to operate until 23rd November 1967, when, consequent on the improvement in prices as a result of the devaluation of the Ceylon rupee, the scheme was withdrawn.

As a result of the increase in wages of the estate workers decided upon by the Government, there has been an increase in the cost of production of tea. To offset this, the Government decided to give a rebate of five cents per pound on low and medium-grown teas sold at the Colombo auctions with effect from the tea auction sale of 2nd January 1968. As there was very little improvement in the prices of high-grown teas, the scheme was extended to cover all high-grown teas as well with effect from the tea sale of 29th October 1968. The total expenditure under the original and revised scheme during the financial years 1966-67 and 1967-68 was Rs. 44,054,797.67 and Rs. 11,859,552.12 respectively. At present a sum of Rs. 45,000 (approximately) per week is being paid out as rebate. Out of the current year's provision of Rs. 16 million, a sum of Rs. 5 million remains unspent.

In the last two months of 1968, there was a fall in tea prices and this has declined further from the first quarter of 1969. In order to give immediate relief to the producers, the Government decided that, in addition to the five cents rebate now being paid on all teas (high, medium and low) sold at the Colombo auction sales, a further rebate of ten cents per pound be granted for all medium and low-grown teas commencing with the auction sale of 5th May 1969.

In view of further deterioration in the market, this fixed duty rebate scheme is being replaced with a sliding scale of rebates with a maximum rebate of 20 cents per pound on all first-hand teas fetching Re. 1 to Rs. 1.09 per pound and progressively reducing to .05 cents per pound for teas fetching Rs. 1.50 per lb. and over. A qualifying limit of Re. 1 per pound has been fixed in order to discourage the offering of poorer grades of tea at the Colombo Auctions. In order to give time for bought leaf manufacturers who serve smallholders of tea to improve the quality of teas manufactured by them, the lower limit has been reduced to 90 cents. A rebate of 20 cents per lb. has been specially fixed for factories undertaking bought-leaf manufacture only, for a period of one month. Only those factories which in 1968 manufactured at least 75 per cent of their output from bought leaf or manufactured at least 100,000 lbs. made tea out of bought leaf in 1968 will be eligible for rebate on the lower limit of 90 cents. The scheme will be applicable to all teas sold at the Colombo Auctions, irrespective of elevational categories.

The revised scheme is estimated to cost the Government an additional sum of Rs. 18½ million above the provision of Rs. 16 million provided in the Estimates 1968/69. This Supplementary Estimate is being presented to meet the additional expenses required to operate the rebate scheme up to the end of the current financial year.

The hon. Members are aware of the situation.

අ. භා. 7.15

බර්නාඩ් සොයිසා මයා.

(திரு. பெர்னட் சொய்ஸா)

(Mr. Bernard Soysa)

Mr. Deputy Speaker, the Hon. Minister's speech in introducing the Supplementary Estimate failed to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

reveal either to this House or to the country at large the real parlous position in which we are placed in regard to our primary export. The first and the largest earning commodity, tea, is now in peril. And what the Hon. Minister has indicated in his very brief introductory comments was merely the structure of the rebate that is being given for the purpose of cushioning the principal owners of the tea produced in this country against the impact of the drop in prices.

Now, Sir, before we can discuss the larger question, if we give our minds to the very structure given by the Hon. Minister, there is one thing that is significant. On previous occasions when a rebate has been given there was some effort made, after representations were made in this honourable House, to enable the small producer, the person who takes his green leaf to the nearest factory, factories that operate on the bought-leaf principle, to obtain at least some relief as a result of a rebate that is granted by Government. The commencement of the grant of a rebate, despite the very parlous position of tea, by the Hon. Minister produced a rebate on terms which would not have rendered anything being passed on, minimal or fractional. But now that he has fixed, on a sliding scale, certain limits within which the rebate granted would fluctuate in accordance with the prices fetched, there should be some opportunity for re-consideration of those measures by means of which a part of this relief at least would go down to those who are really in need of it—the small acreage owner, the small producer who sells his green leaf and survives upon that.

My principal comment upon the Minister's scheme of rebates is that he failed to indicate any steps that would be taken by his Honourable Colleague in the Cabinet or any of the departments under him in regard to this matter.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

Why not ? Special consideration for the smallholder, and bought-leaf factories.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

But how are you going to ensure it ? That is what I am indicating. I am not denying the intention of a rebate, the intention may be there. What is the machinery you have ?

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

Last time we got the departmental personnel to—[*Interruption*].

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

When you have a sliding scale you will have to work out a system so that a given fraction of this rebate that is being granted, can be passed on.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

All those instructions are with the field staff.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

We should like to know. That is why I complain that we have not been told how it would be operated. I should be glad if any other Minister, perhaps the Minister of Commerce and Trade, would outline—[*Interruption.*]

ගරු හියු ප්‍රනාන්දු
(கௌரவ ஹியூ பெர்னண்டோ)
(The Hon. Hugh Fernando)

What is it that you want to know ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

What is the structure by means of which this will come down? And, within what limits are you prepared to send it down, because there is a fractional limit reached on your sliding scale at which it will not go down. There will be a point reached, in the fluctuation of prices, at which you cannot go down. What is the area within which it will go down? And what are the means that you have of ensuring it? I ask that question because that is the primary consideration, and those are the people worst affected.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

It has been looked into.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னுட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

I am glad it has been looked into. I should be glad if either the Minister of Commerce and Trade or the Minister of Agriculture and Food, when he speaks on this subject, would give us an indication of what is proposed to be done.

Outside that is the larger question that the Hon. Minister is running very fast, and he cannot even remain in the same place as he is being pushed back! This is more or less like the Red Queen in the tale of Alice through the Looking Glass where she runs very fast in order to go backward. The Government, in respect of tea, has been running for the last 4½ years and has not been able to remain in the same place in regard to that matter. With every single measure that is decided or talked about, with every conference that is attended internationally, with every conference that is held in this country with visitors coming from abroad, with all those expensive trips made by the officials of the Planning Ministry downwards, prices continue to drop.

පරිපූරක මුදල්

